

# ප්‍රජාශක්ති

2025 පළමු කලාපය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

# ප්‍රජාශක්ති

අර්ධ වාර්ෂික ප්‍රකාශනය

2025 පළමු කලාපය

*ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි*


**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය**
**අංක 24/4, කාසල් විදිය, කොළඹ 08**

ප්‍රධාන කාර්යාලය, බොරැල්ල

දුරකථන :- 011 269 5579
ෆැක්ස් :- 011 269 6592
වෙබ් :- www.rdtri.gov.lk

පුහුණු මධ්‍යස්ථානය, පිළිමතලාව

දුරකථන :- 081 257 5292
ෆැක්ස් :- 081 257 9929
වෙබ් :- dodd.dtri@gmail.com

## උපදේශකත්වය

**තිලිණි සුරංගිකා කරස්නාගොඩ**
අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**ඩබ්ලිව්.කේ.එන්.එන්.කෞෂල්‍යා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**දිලූපා එන්. අඹේපිටිය**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## සංස්කරණය

**ප්‍රියශාන්ත කාරියවසම්**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**කේ.එම්.ජී.සමරසේන**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**එස්.ඩී.අල්ගම**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
**ඒ.එන්.විතානගේ**
සංවර්ධන නිලධාරි
**එස්.බී.එන්.මල්ෂානි ආනන්ද**
සංවර්ධන නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## විද්‍යුත් මාධ්‍යගත කිරීම

**පී.ඒ. චිත්‍රා ජයසිංහ**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## පිටකවරය

**ඒ.එන්.විතානගේ**
සංවර්ධන නිලධාරි

## අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය.

සංවර්ධනය වූ කලී විවිධ විග්‍රහයන්ට යටත්ව විවිධ නිරුක්ති ඇත්තකි. ඒවායේ තේරුම් ගැනීම් වලට අදාළව හා ක්‍රියාකාරකම් වලට සාපේක්ෂ අගයක් පෙන්නුම් කරයි.

ආයතනික වශයෙන් පුද්ගලික විමසුම් කෙසේ වුවද ආණ්ඩුකරණය තුළින් ගම්‍යවන සංවර්ධනය පිළිබඳව ගැඹුරු තේරුම් ගැනීමක් පවතී. ඒ රාජ්‍යතාන්ත්‍රීකරණ වෙතින් මතු කරන සංවර්ධන ගමනේ ගහ, කොළ, සතා සිවුපාවුන් මෙන්ම මනුසතා පිළිබඳව මෙන්ම අනාගත පරපුරටද සාධාරණ ගමනක් මතු විය යුතු බව නූතන විශ්ලේෂණය වේ.

එය වඩාත් තීව්‍ර කරන විවරණයකින් ''පොහොසත් රටක් ලස්සන ජීවිතයක්'' යන ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් දැසට මෙන්ම මනසටද දැඩිව දැනෙයි.

උක්ත මුඛ්‍ය තේමා පාඨය සහිත වැඩසටහන ජය ගනු වස් නිම නැති තැතක අධිෂ්ඨානශීලී වීර්යයක් ගත යුතුව ඇත. එම උදාර  කාර්යය සඵල කර ගැනීම පුරවැසි සමස්තයේ එකම ප්‍රාර්ථනාව විය යුතුය.

ඒ මඟ හැරෙන්නට වෙන මඟක් නොවේ යයි අතීත සංවර්ධන ව්‍යායාමයන් සමාලෝචනයෙන් හා අධ්‍යනයෙන් පැහැදිලි කර ගත හැක.

මානව වංශ කතාවේ පරිණාමය තුළ සංවර්ධනය ධරණීය ආකෘතියක හැඩතල නොගැනීමම මානව හා භෞතික ක්ෂේත්‍රයන් දැඩි අගතියකට පත්වීම නොවැලැක්විය හැක. එහි අනිටු ඵලයන්  ගෝලීය සමාජයේ පැවැත්ම අකර්මණ්‍ය  වන බව නොරහසකි.

ඉදින්, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මඟින් එළි දක්වන ''ප්‍රජාශක්ති'' සඟරාවෙන් සංවර්ධනය පිළිබඳව විවිධ හැඩතල වලින් යුතු තිරසර සංවර්ධන එළඹුමක් පිළිබඳ කතිකාවතකට ඔබටද ආරාධනා කරමි.


අධ්‍යක්ෂ

තිලිණි සුරංගිකා කරස්නාගොඩ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

# සංස්කාරක සටහන

සංවර්ධනය යන්න තවමත් ලොව බොහෝ රටවලට සිහිනයක් පමණක්වී ඇති සංකල්පයකි. එය යථාර්ථයක් බවට පත්වීමට නම් සමාජ ප්‍රපංචයන්හි තුලනාත්මක වර්ධනයක් සිදුවිය යුතුය. සංවර්ධනය යන විසල් වෘක්ෂයෙහි අනු ශාඛාවක්වන ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි, රටක සමස්ථ සංවර්ධන අභිලාෂයන් මුදුන්පමුණුවා ගැනීමේ දී අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය. නූතන ලෝකයේ වෙනස්වීම් හමුවේ "ගම" යන සංකල්පය ද වර්තමානයවන විට කාලානුරූපීව වෙනස් වෙමින් පවතී. තාක්ෂණයේ ගොදුරක් බවට පත්වී ඇති නූතන සමාජ සංදර්භය තුළ සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට යන මාවතේ ශ්‍රී ලංකාව තවමත් මුල් බිජුවට වපුරමින් සිටී.

තිරසර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීමේ දී ‘‘සෑම තැනකම සෑම ආකාරයකම දරිද්‍රතාව අවසන් කිරීම’’ යන ජාත්‍යන්තර සම්මුතියට අනුකූලව, මූල්‍යමය දරිද්‍රතාවයට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ජීවන තත්වය යන පැතිකඩවල් ඔස්සේ සාකච්ඡාවට බඳුන් කෙරෙන දරිද්‍රතාවයේ නූතන මානයක් වන බහුමාන දරිද්‍රතාව අවමකර ගැනීම සඳහා ශ්‍රී ලංකාව විවිධ සංවර්ධන උපාය මාර්ගයන් භාවිතා කරමින් සිටී. වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව" පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කරා යන ගමනේ දී  සමස්ත ප්‍රජාවේම සහභාගීත්වය සෑම අංශයකින්ම වැදගත් වේ.

සංවර්ධන ප්‍රවාහයෙන් දුරස්ව සිටින ප්‍රජාව ඒ කෙරෙහි යොමුකර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් උපයෝගීකර ගනු ලැබේ. එහිදී සමාජයේ කුඩාම ඒකකයවන පවුල නැතහොත් කුටුම්භය සවිබල ගැන්වීම තුළින් ග්‍රාමීය ප්‍රජාව සමස්ත සංවර්ධන ක්‍රියාවලියේම හවුල්කරුවන් බවට පත්කර ගැනීමට සහභාගීත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිතයට ගනිමින් පුහුණු, පර්යේෂණ හා තොරතුරු සම්පාදනය තුළින් "සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් උදෙසා ප්‍රජාව සවිබල ගැන්වීමේ ප්‍රමුඛ ආයතනය බවට පත්වීම" ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ දැක්ම වේ. ඒ අනුව සංවර්ධන ක්ෂේත්‍රයේ විවිධ ක්‍රියාකාරකම්හි නිරත මානව සම්පත සතු දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින්  ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මඟින්, ලිපි මාලාවක් ප්‍රජාශක්ති විද්‍යුත් මාධ්‍ය සඟරාව ඔස්සේ දිගහැරේ. ප්‍රජාශක්ති සඟරාව සඳහා ලිපි හා නිර්මාණ සම්පාදනයෙන් දායකත්වය දැක්වූ සැමට තුති පුදකරන අතර, පරිශීලනය කරන ඔබට ද කිසියම් වූ අත්වැලක් සැපයෙනු ඇතැයි අප විශ්වාස විශ්වාස කරන්නෙමු.

**සංස්කාරක මණ්ඩලය**

# ……..ලිපි පෙළගැස්ම……..

1) රටක සංවර්ධනය යනු පුද්ගල සංවර්ධනයයි. ආකල්ප සංවර්ධනය තුළින් ජීවිතය ජය ගනිමු
ඩබ්ලිව්. එච්. සිරිසේන

2) ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ තිරසර බව උදෙසා විපර්යකාරක වැඩසටහනේ සමාජ විද්‍යාත්මක අගයන් ගළපා ගනිමු
ඩී.ඒ.පී.දාස්වත්ත

3) "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යථාර්ථයක් බවට පත්කරගැනීමට ප්‍රජාවේ ආකල්ප කෙසේ සකස් විය යුතුද?
කේ.බී. ධර්මප්‍රිය

4) සෝජාන් වගාව
පී.ඒ.චිත්‍රා ජයසිංහ

5) "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යථාර්ථයක් කර ගැනීමට පුද්ගල චර්යාවේ ඇතිකර ගතයුතු වෙනස්කම්
චම්පා අල්විස්

6) සහභාගිත්ව කළමනාකරණය මඟින් පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගොඩනගමු
කේ.එම්.ජී.සමරසේන

7) මුහුණු පොතෙන් කතාවක්
ඒ.එන්. විතානගේ

8) හරිත විප්ලවය සහ පාරිසරික අර්බුද
එස්.බී.එන්.මල්ෂානි ආනන්ද

9) "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ඇතිකිරීම සඳහා ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයින් බලගැන්වීමේ වැදගත්කම
සුභානි පියසිංහ




ආකල්ප යන්නෙහි අර්ථය කෙටියෙන් කියතොත් විශාල වෙනසක් ඇති කරන කුඩා දෙයකි. ජීවිතය තුළ ඉතා විශාල ලෙස වෙනසක් ඇති කරන ඉතාම කුඩා දෙයකි. එය යම් ක්‍රියාවක් හෝ සිතිවිල්ලක් ක්‍රියාත්මක කිරීමක් විය හැකිය. ජීවිතය සාර්ථක කර ගැනීමට නම් ආකල්ප සංවර්ධනය කර ගැනීම පිළිබඳව යම් අවබෝධයක් තිබිය යුතුය. ආකල්ප ගොඩනැගී ඇත්තේ අප තුළමය. ඒවා සෘණාත්මක ආකල්ප මෙන්ම ධනාත්මක ආකල්ප ලෙස ද ක්‍රියාත්මක වේ. සාමාන්‍යයෙන් පුද්ගලයා තුළ ආකල්ප ගොඩනැගීම කෙරෙහි බලපාන සාධක කිහිපයකි. තම අදහස්, අතීත අත්දැකීම්, ස්වකීය සංකල්පයන්, අරමුණු, මනෝභාවයන් ඉන් ප්‍රධාන වේ. ආකල්ප ගොඩනැගීම කෙරෙහි බලපාන ඉතාම කුඩා ඒකකය ලෙස පුද්ගල අත්දැකීම් දැක්විය හැකිය. ගොඩනැගී ඇති පුද්ගල විශ්වාස, මතකයන් හා අගයන් මත ආකල්ප ගොඩනැගීම සිදු වේ. උපතේ සිටම පුද්ගලයින් තුළ ආකල්ප වර්ධනය වීම සිදු වේ. එය තම පරිසරයට සාපේක්ෂව සිදුවන්නකි. අප විසින්ම හදාගත් නීතිරීති නිසාවෙන් අප තුළ ගොඩනැගුණු ආකල්ප දැකිය හැකිය.

ආකල්ප මිනිසා මිනිසෙකු ලෙස ජීවත් කරනවා යැයි කීම වඩාත් නිවැරදි ය. ආකල්ප මිනිස් පෞරුෂය කෙරෙහි ද විවිධ අයුරින් බලපෑම් ඇති කරයි. පුද්ගලයාගෙන්, පුද්ගලයාට මුහුණ දෙන අවස්ථා හා එහි ස්වභාවය, සමාජ වටපිටාව මත ආකල්ප වෙනස් වන්නකි. අප නොදැනුවත්වම මේ ආකල්ප මගින් අපගේ ජීවිතය පාලනය කරයි. මිනිස් ආකල්ප සංවර්ධනය කළ යුත්තේ කුඩා අවදියේ පටන්ය. වර්තමානයේ පවුලේ, සමාජයේ හා රැකියා ස්ථානයේ මෙන්ම රටේ දියුණුව සඳහා යහපත් ආකල්ප වර්ධනයේ අවශ්‍යතාව ඉස්මතුව ඇත. කිසියම් ආකල්පයක් සෘණාත්මක හෝ ධනාත්මක වීමට බලපාන සාධක රාශියකි. කිසියම් පුද්ගලයෙකු සතු මනෝභාවය, ඒ පුද්ගලයා සමාජයෙහි සෙසු පුද්ගලයන් සමග කටයුතු කරන ආකාරය හා හැසිරෙන ආකාරය යනාදි යයි. සමාජ ආකල්පයන් ගොඩනැගීම සඳහා පුද්ගල ආකල්ප හේතු සාධක වේ. පුද්ගල ආකල්පවල බලපෑම සමාජ ආකල්ප සකස් වීම කෙරෙහි බලපායි. සංවර්ධනය උදෙසා ආකල්ප ප්‍රබල බලපෑමක් සිදුකරන බව ප්‍රකාශ කරන්නේ වර්තමානයේ පුද්ගලයා හා සමාජය, ආකල්පමය වශයෙන් දුර්වලව ඇති හෙයිනි.

ඍණාත්මක ආකල්පවලින් යුත් සමාජය රට අගාධයට ඇද දැමීමට සමත් වූ අවස්ථා ඇත. ඇතැම් අවස්ථාවල දී සොර සතුරන් කරන හානියට වඩා වැඩි හානියක් ඍණාත්මක සමාජාකල්පවලින් සිදුවන බව දක්නට ඇත. ඍණාත්මක සාමාජාකල්ප සහිත පිරිසක් එක්වී සමාජ ස්ථාවරත්වය බිඳ දැමීමට ද ක්‍රියාත්මක විය හැකිය. මෙමගින් සමාජය පුරා වෛරය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, පළිගැනීම, කුහක කම, එකිනෙකා කෙටවීම වැනි විවිධ ඍණාත්මක ආකල්ප හට ගැනීමට ඉවහල් වන වටපිටාවක් නිර්මාණය වීමට පසුබිම සැකසේ. **වර්තමාන සමාජයේ සමාජ සම්බන්ධතා තුළ පවතින අසහනය හා කළකිරීම මිනිස් ආකල්ප සංවර්ධනය නොවීමේ ප්‍රතිඵලයන්ය. සුභවාදී ආකල්ප වර්ධනය සෑම ස්ථරයකම සිදුවිය යුතු අතර, එය ප්‍රායෝගිකව අත්විඳීමට ද ඉඩ සැලැස්විය යුතුය. මන්ද මිනිසකුගේ ජීවිතය වෙනස් කිරීමට පළමුව ඔහුගේ ආකල්ප වෙනස් විය යුතුය. ඔහුගේ ආකල්ප ඔහුගේ ජීවිතය බවට පත්වන නිසාවෙන්ම ඒවා ඉතා වැදගත් වේ. සමාජය විසින් නරක දේ සඳහා ඍණාත්මක පෙළඹවීම් හා හොඳ දේ සඳහා ධනාත්මක පෙළඹවීම් ලබාදෙන බැවින් නරක අත්හැර හොඳ දේ කිරීමට අයෙකු තුළ කිසියම් නැඹුරුවක් ඇති වේ.**

සමාජ විරෝධී අදහස් හා ආකල්ප සහිත විවිධ පුද්ගලයන් බිහිවීමට ජීවිතයේ එක් කලකදී ලැබූ වැරදි ආකල්ප හා චර්යා පුහුණුවක් ඉවහල් විය හැක. පුනරුත්ථාපනය මගින් සිදු කරනුයේ මේ අයුරින් වැරැදි ඉගෙනුමක් ලැබූ අයගේ එකී අයහපත් ආකල්ප හා චර්යා සමාජ සම්මත ආකල්ප හා චර්යා බවට පරිවර්තනය කිරීමකි. අයහපත් චර්යා හා ආකල්ප නිසා කෙනකු නරක යැයි සම්මත පුද්ගලයකු බවටත්, යහපත් චර්යා හා ආකල්ප නිසා කෙනකු හොඳ යැයි සම්මත පුද්ගලයකු බවටත් පත්වේ. මේ හොඳ බව හා නරක බව නම් කාලයට සාපේක්ෂව පවත්නා සමාජ පිළිගැනීමකි. කෙනකු උපතින් හොඳ හෝ නරක අයෙකු නොවේ. ළදරුවන් කාලෙ සිට අපට බැහැරින් එකතු වන ආකල්ප අප සමඟම වර්ධනය වේ. කාලයත් සමග අපටම අනන්‍ය වූ ආකල්ප රාශියක් ජීවිතයට බද්ධ වන හෙයින් අපට නොදැනීම මේ ආකල්ප මගින් අපේ ජීවිත පාලනය කෙරේ. ඒ නිසාම ආකල්පමය රාමුවක් තුළ අපේ ජීවිතය සිරවේ. ඒ අතරින් සමහර ආකල්ප මගින් ජීවිතය මන්දගාමී බවට පත් කරන අතර, ධනාත්මක, ශුභවාදී ආකල්ප ජීවිතය ජය ටැඹ කරා රැගෙන යයි.




ඔබ කොතරම් ඉදිරියට ගියත්, මොන තරම් දෑ අත්පත් කර ගත්තත් ඔබ සෑහීමට පත්නොවන අවස්ථා ඇත. ජීවිතය දිනනවා කියන්නේ මුදල්වලින් ආඪ්‍ය වීම පමණක් නොවෙයි. සතුට, ආදරය, සැනසිල්ල, නිරෝගිකම මේ සෑම දෙයක්ම ජයග්‍රාහී ජීවිතයකට අයිති දේවල්. මොනතරම් ධනවත් බවක් තිබුණත්, ආකල්පවලින් ඔබ දුගී නම් ඔබ අසාර්ථකයි. ඒ නිසා ලද දෙයින් සතුටු විය හැකි ආකල්ප ඔබ ඇති කරගත යුතුය. එසේ නොමැතිව ජීවිත කාලය පුරාවටම ඔබ වෙහෙස මහන්සි වුවත් ඔබට ඉතිරි වන්නේ වෙහෙසක්ම පමණි.

ජයග්‍රාහී ජීවිතයක් පතන ඔබ ඔබේ පරාජිත ආකල්ප ජයග්‍රාහී ආකල්ප බවට පත් කරගත යුතුයි. ඔබේ අතෘප්තිමත් ආකල්ප තෘප්තිමත් ආකල්ප බවට පත් කර ගත යුතුයි. නිතරම "නැහැ – බැහැ"කියන සෘණාත්මක ආකල්ප වෙනුවට "ඔව් මට පුළුවන් - මට ශක්තිය තිබෙනවා" වැනි ධනාත්මක ආකල්ප ඇති කර ගත යුතුයි. ආකල්ප වෙනස් කර ගත්, ජීවිතය වෙනස් කරගත් මිනිසුන් ගැන ඕනෑ තරම් සාක්ෂි අතීතයෙන් වගේම, වර්තමානයෙන් ද සොයාගත හැකිය. කාලයක් තිස්සේ මුල් බැසගත් ආකල්ප එක්වරම වෙනස් කිරීමට නොහැක. දැඩි උවමනාවෙන් කැපවීමෙන් ක්‍රියා කරන්නේ නම් සෘණාත්මක ආකල්පවලින් මිදී ධනාත්මක සුබවාදී ආකල්ප ඇති කර ගත හැකිය. ඒ සඳහා අවශ්‍ය පොතපත කියවීමෙන්, සරුසාර මතයන් ඇති, නිවැරැදි කතා බහ ඇති මිනිසුන් ඇසුරු කිරීමෙන්, යහපත් ක්‍රියාකාරකම්වල යෙදීමෙන් අයහපත් ආකල්ප වෙනස් කර ගත හැකිය.

අද වන විට පවුලේ, පාසලේ, රැකියා ස්ථානයේ, පොදු සමාජයේ මෙන්ම රටේ දියුණුව සඳහා යහපත් ආකල්ප සංවර්ධනයේ අවශ්‍යතාව ප්‍රබලව ඉස්මතුව ඇත. මේ කාර්යය කිරීමේදී සෑම ක්ෂේත්‍රයට හිමිවනුයේ වැදගත් ස්ථානයකි. වර්තමානයේ පවතින තරඟකාරී සමාජ ආර්ථික රටාවට තුළ මෙම කාර්යභාරය ඉතා අභියෝගාත්මක එකක් බවට පත්ව ඇත. සංවර්ධනය උදෙසා ආකල්ප සංවර්ධනය බෙහෙවින්ම වැදගත් වේ. අද පවතින සමාජ ආර්ථික පරිසරය තුළ පවතින පහසුකම් අතීතයට වඩා වෙනස් මුහුණුවරක් ගෙන ඇත.


පුද්ගලයෙක් තුළ ආකල්ප සංවර්ධනය විය යුත්තේ කුඩා අවධියේ සිටය. අදවන විට තාක්ෂණයත් සමඟ අලුත් ලෝකයට පිවිසෙන දරුවා තුළ තිබෙන ළබැඳියාව, දයාව, දෙමව්පියන්ට හා ගුරුවරයාට ඇති ගරුත්වය හදවතින් ගිලිහී යන ආකාරයක් පෙන්නුම් කරයි. කාර්යබහුල සමාජයේ කාලය කළමනාකරණය කර ගැනීමට නොහැකි වී තිබෙන්නේද ඔවුන් පමණ ඉක්මවා තාක්ෂණය සමඟ මුසුවීමෙනි. එහිදී සමාජය තුළ විවිධ අවස්ථාවන්හිදී, විවිධ ස්ථානවලදී හැසිරිය යුතු ආකාරය, විවිධ අවස්ථාවන්ට මුහුණදෙන ආකාරය ක්‍රමානුකූලව වටහා දිය යුතුව ඇත. එසේම රටේ වෘත්තිකයකු බවට පත්වූ විට යහපත් ධනාත්මක ආකල්ප ඔස්සේ හැසිරිය යුතු ආකාරය, කටයුතු කළ යුතු ආකාරය අවබෝධ කර දිය යුතුය. විශේෂයෙන්ම පොතපතේ දැනුමට එහා ගිය නව සමාජයක යහපත් ආකල්පවලින් පරිපූර්ණ පුද්ගලයකු බවට පත්විය යුතුය. මෙය පවුලෙන් පටන් ගෙන සමාජයේ සෑම තලයකම ක්‍රියාත්මක වන්නේ නම් සංවර්ධනය අත්කර ගැනීම අසීරු කාර්යයක් නොවනු ඇත. ආකල්ප සංවර්ධනය මිනිසා මිනිසෙකු ලෙස ජීවත් කරනවා යැයි කීම වඩාත් නිවැරැදිය. ආකල්ප, මිනිස් පෞරුෂය කෙරෙහිද විවිධ අයුරින් බලපෑම් ඇති කරයි. පුද්ලයාගෙන් පුද්ගලයාට මුහුණදෙන අවස්ථා සමාජ වටපිටාව මත ආකල්ප වෙනස් වීම සිදුවේ. එහිදී අප නොදැනුවත්වම යහපත් හෝ අයහපත් ආකල්ප අපගේ ජීවිතය පාලනය කරයි. රටක් සංවර්ධනය වීමට ආකල්ප සංවර්ධනය ඍජුවම බලපවත්වන කරුණකි. යහපත් ආකල්පවලින් පිරි මානව සම්පතක් ගොඩනැගීම ඉලක්ක කර විවිධ වූ මානව සම්පත් සංවර්ධන ප්‍රයත්නයන් දිශාගත කළ යුතුය.




සමාජය තුළ යහපත් ආකල්ප පිරිහීමට විවිධ කරුණු බලපානු ලබයි. අපේ රටේ ආකල්ප අතීතයේ සිටම යම් ආකාරයේ පිරිහීමකට ලක්වෙමින් පවතී. ඇතැම් රටවල එකිනෙකාට ගරු කිරීම, ස්තුතිවන්ත වීම යනාදිය සිදුවන නමුත්, මෙරටෙහි මිනිසුන් අනවශ්‍ය දෑ සෙවීම, තමා නිවැරැදි කර නොගෙන අනුන් නිවැරදි කරන්න යෑම නිසා පුද්ගල සංවර්ධනය සහ ආකල්ප පිරිහීමට පත්ව ඇත. මෙහිදී තම තමන් යහපත් ලෙස වෙනස් වීම මගින් රටක් වශයෙන් අපට ඉදිරියට යා හැකිය. තමන් කරන කටයුතු අනෙකාට හිරිහැරයක් වෙනවාද කියා බොහෝ දෙනෙක් නොසිතති. කණගාටුවට කරුණ වනුයේ තමන්ගේ පහසුව ගැන මිස සෙසු අයට අපහසුවක් වෙයිද කියා සිතන්නට තරම් ජනතාව තුළ යහපත් ආකල්ප වර්ධනය වී නොතිබීමය.

සමාජයක් තුළ නිරන්තරයෙන්ම දුර්වල ආකල්ප පවතී නම් එම සමාජය විනාශ මුඛයට යයි. මතුපිටින් භෞතිකව නොපෙනුනත් ඇතැම් අවස්ථාවල එය සොර සතුරන් කරන හානියට වඩා වැඩි හානියක් සිදු කරයි.

ඩබ්ලිව්. එච්. සිරිසේන
පුහුණු හා පර්යේෂණ නිලධාරී
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
බොරැල්ල



## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ තිරසර බව උදෙසා විපර්යකාරක වැඩසටහනේ සමාජ විද්‍යාත්මක අගයන් ගළපා ගනිමු

සංවර්ධනය පිළිබඳ කතිකාව තුළ ග්‍රාමසංවර්ධනය යන්න වෙනම අනන්‍යතාවයක් සහිතව දීර්ඝ කාලයක් තිස්සේ පෝෂණය වූ සංවර්ධනයේ අනු ශාඛාවකි. අප රට නිදහස ලබා දශක අටකට ආසන්න කාලයක් ගතවුව ද සංවර්ධනය සම්බන්ධයෙන් සාපේක්ෂව මෙන්ම නිරපේක්ෂවද සතුටු විය හැකි මට්ටමක නොමැති බව පොදු පිළිගැනීම වේ. දුප්පත්කමේ ගැටළුව ජය ගැනීමට අප සමත් වි ඇත්තේ අවම මට්ටමකිනි.

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක් " තේමාව යටතේ ක්‍රියාත්මක වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ග්‍රාමීය වශයෙන් පවත්නා බහුමානීය දිළිඳුකම අවම කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුව ඇත. එසේම 2030 වසර දක්වා වන, තිරසර සංවර්ධන අභිලාශයන්ට අනුව ශ්‍රී ලංකාව තුළ සෑම ආකාරයකින්ම පවතින දුගී බව අවසන් කිරීම අරමුණු කෙරේ. පවත්නා සමාජ ආර්ථික අභියෝග ජයගැනීම උදෙසාත් ඉහත අරමුණු වල සඳහන් පරිදි දුගී බව අවම කරලීම උදෙසාත් ශක්තිමත් වූ ප්‍රජා බල ගැන්වීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වේ.

දිළිඳු බව පිළිබඳ සමාජ ගැටළුවට තිරසාර විසඳුමක් නිර්මාණය කරලීමේ අරමුණින් 1978 වසරේ විපර්යකාරක වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන විද්වතුන් විසින් නම් කරනු ලැබුයේ ග්‍රාමසංවර්ධනය පිළිබඳ වූ කාර්ය බද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන (Action Research & Training Programme for the Rural Development) වශයෙනි. සමාජ පර්යේෂණ වල ඉතා සුවිශේෂී මෙන්ම වඩාත් ඵලදායි ප්‍රායෝගික ගවේශන ක්‍රමවේදයක් ලෙස කාර්ය බද්ධ පර්යේෂණ හැඳින්වේ. ජපානයේ ආසියානු ග්‍රාම සංවර්ධන ආයතනය මෙම ක්‍රමවේදය වැඩ හරහා ඉගෙනුම (Learning by doing) වශයෙන් හඳුන්වයි. ප්‍රධාන සමාජ ගැටළුවක් පදනම් කරගෙන ආරම්භ කරනු ලබන සමාජ පර්යේෂණය තුලින් හඳුනා ගනු ලබන නව සොයා ගැනීම් ක්‍රියාකාරි සමාජය සඳහා ගළපාලීම මෙහි සුවිශේෂීත්වයයි. විපර්යකාරක වැඩසටහන සෙසු සංවර්ධන ප්‍රවේශයන්ගෙන් වෙනස් වන්නේ මෙම ලක්ෂණය නිසාය.

**විපර්යකාරක වැඩසටහනේ ප්‍රධාන බලකණු දෙකකි. එනම් ස්වශක්තිය හා සහභාගිත්වයයි. ස්වශක්තිය යනු සිතේ සැබෑ ශක්තිය හඳුනාගැනීම හා එය සංවර්ධනය සඳහා ගළපා ගැනීමයි. මෙය මනෝ විද්‍යාත්මක සංවර්ධන ක්‍රමවේදයකි. "සහභාගිත්වය" යනු සෙසු සමාජයට සහ සමාජ ක්‍රියාවලියට අවතීර්ණ වීමයි. එනම් සෙසු අය හා එක්ව නවමු සංවර්ධන ක්‍රියාවලියක් සාමූහිකව නිර්මාණය කිරීමයි. සාමූහිකත්වය**

**(Unity) යනු සමාජ පැවැත්මේ ගාමක බලවේගය බව ටී.ආර්. බැටන් (1949) ප්‍රජා සංවර්ධන න්‍යාය නැමති කෘතියේ දක්වා ඇත. මෙම සාමුහිකත්වය තුළ එකිනෙකාට ඇහුන්කන්දීම, ගෞරව කිරීම හා ප්‍රතිගෞරව කිරීම ගොඩනැගේ. එබැවින් සාමුහිකත්වය සහභාගිත්ව ක්‍රියාවලියේ පදනම ලෙසද හැදින්විය හැක.**

මෙම සමාජ හා මනෝ විද්‍යාත්මක පදනමකින් යුතු විපර්යකාරක වැඩසටහන 1978-1998 කාලය තුළ පූර්ණ රාජ්‍ය අනුග්‍රහය හා NORAD/CIDA/CARE වැනි විදේශ ආයතන රැසක මූල්‍ය හා වෙනත් අනුග්‍රහයන් ලබමින් විශ්ව විද්‍යාල විද්වතුන්ගේද උපදේශකත්වය ලබමින් සංවර්ධන ක්ෂේත්‍රයට ඉහළ දායකත්වයක් ලබාදුනි. 1998 වසරේ රාජ්‍ය අනුග්‍රහය නිමා වීමත් සමඟ පර්යේෂණ අවධිය නිමා වුවද වර්තමානය දක්වාම මෙම වැඩසටහනේ මූලික හරයන් සංවර්ධන ක්ෂේත්‍රය තුළ භාවිතයට ගැනීම යථාර්ථය වේ.

විපර්යකාරක වැඩසටහන සමාජයට විශාල බලපෑමක් කිරීමට සමත්වී ඇත. මිනිසුන්ට ජීවන ක්‍රියාවලිය පිළිබඳ අවබෝධ කර දීමටත් , භෞතික හා මානව සම්පත් හඳුනා ගන්නටත් එමගින් සංවර්ධන ක්‍රියාවලිය නැවත ප්‍රතිනිර්මාණය කළ හැකි බවත්, සමාජය අකර්මන්‍ය කරන අනවබෝධය පහකරලීමටත් සාමුහිකත්වය සංවර්ධන මෙවලමක් ලෙස ගළපා ගැනීමට හැකි බවත් තහවුරු කර ඇත. මෙම වැඩසටහන ජීවන ක්‍රියාවලිය තුළ සමාජ හරයන් විග්‍රහ කර ඇත්තේ පූර්ණ ප්‍රජා සහභාගිත්වය තුළය. ප්‍රජාවට සිය ජීවන ක්‍රියාවලිය පවත්වාගෙන යාමට අවශ්‍ය නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය මෙම වැඩසටහන තුළ රැදී පවතී. මේ තුළ ප්‍රජාව එකිනෙකාගෙන් උගනී. සමාජයෙන් සමාජ වැඩ වලින් උගනී. ආදායම් වියදම් රටාවන්, ණය ක්‍රියාවලින් වැනි දේ පිළිබඳව ක්‍රියාදාමය තුළින් උගනී. (Learning by doing)

විපර්යකාරක වැඩසටහන සාර්ථක කුඩා කණ්ඩායම් ක්‍රියාවලියක් සමාජයට දායාද කර දී ඇති අතර එමගින් කාන්තාව/පවුල සමාජ ආර්ථික වශයෙන් බලගැන්වීම පිළිඹිබු කරයි. මෙම කුඩා කණ්ඩායම සම්මතයන් ,නීතිරීති, ව්‍යවස්ථා සමාජයට කියාදෙයි.

වර්තමානය වන විට සමස්ත විශ්වයම වාණිජකරණයට ලක්ව ඇත. පාරිභෝජන සමාජ ක්‍රමය තුළ පුද්ගල භේදයකින් තොරව තරගයක නියැළී සිටී. විපර්යකාරක වැඩසටහන සමාජයේ සමබර බව ආරක්ෂා කරන්නට කටයුතු කරයි.

මෙම වැඩසටහන තුළ ගාමක බලවේගය ලෙස මැදිහත්කරු නැමති චරිතය ක්‍රියාත්මක වේ. සංවර්ධන වැඩකරුවන්ට අවශ්‍ය මානව දයාව, තමන් ජීවත් කරවන්නේ මෙම ප්‍රජාව යන හැඟීම, තමන් මෙන්ම ප්‍රජාවද දැනුමෙන් සමන්විත වන බව, සංවර්ධනය තුළ ලොක්කෙකු නොව නායකයෙකු විය යුතු බව යනාදි කරුණු

මැදිහත්කරු චරිතය තුළින් වර්තමාන සමාජයේ සංවර්ධන වැඩකරුවන්ට කියා දෙයි. සමාජ පර්යේෂකයෙකු, විශ්ලේෂකයෙකු , සැලසුම් කරුවෙකු , පුහුණුකරුවෙකු ලෙස කටයුතු කරන මැදිහත්කරු විපරිණාමය වන ගම, පවුල, අඛණ්ඩ පර්යේෂණ ක්‍රියාදාමයක් තුළ බල ගැන්වීම අත්‍යවශ්‍ය වේ. එවිට අනුකරණ න්‍යාය මත නවීකරණය වෙමින් විපරිණාමයට පත්වන සමාජය තුළ මතුවන අලුත් සමාජ ගැටළු සඳහා කාර්යබද්ධව විසඳුම් ලැබෙනු ඇත.

සමාජය තුළ පවුල, ආර්ථිකය, ආගම,අධ්‍යාපනය, දේශපාලනය, නීතිය වැනි සමාජ සංස්ථා එකක් මත එකක් යැපෙන ස්වභාවයකින් හා අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවත්නා ස්වභාවයකින් යුක්ත වේ. එසේම සමාජය තුල පවත්නා දිළිඳු බව, සමාජ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මානව බලය හා මානව ගුණය හීන කිරීමට හේතුවේ. වර්තමාන සමාජයේ උප සමාජ ව්‍යුහයන් තුළ සිදු වන සමාජ විකෘතීන් දෙස බලන විට විපර්යකාරක වැඩ සටහනේ මූලධර්මයන් මෙන්ම ඒතුලින් හඳුනාගත් සංවර්ධන මෙවලම් හා උපාය මාර්ග සියල්ලම වර්තමාන සංවර්ධන ක්‍රියාවලියට ගළපා ගැනීම උචිත වේ.

එබැවින් වර්තමාන රජයේ සංවර්ධන ප්‍රතිපත්තිය වන පොහොසත් රටක් ලස්සන ජීවිතයක් තුළ අන්තර්ගත සංවර්ධන සිහිනය යථාර්ථයක් බවට පත්කර ගැනීම උදෙසා, ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයක්, ශිෂ්ටසම්පන්න පුරවැසියෙක්, තෘප්තිමත් තාරුණ්‍යයක්, නිර්මාණශීලි අනාගත පරපුරක්, ගෞරවනීය වෘත්තීය ජීවිතයක් ,සහකම්පනීය ජනතාවක්, ආහාර සුරක්ෂිත රටක්, සාකල්‍ය ආර්ථිකයක් අප රට තුළ නිර්මාණය කරලීමට නම් සමස්ත ප්‍රජාව සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක න්‍යායන් හා භාවිතයන් ඔස්සේ බල ගැන්වීම අත්‍යවශ්‍ය වේ.

මෙහිදී විපර්යකාරක වැඩසටහන තුළින් සංවර්ධන ක්ෂේත්‍රයට හඳුන්වාදුන් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ගළපා ගැනීම වඩාත් සුදුසු යැයි හැඟේ. ඒ තුළ සෑම වසමකම වසම් මට්ටමෙන් සේවය කරන රාජ්‍ය නිලධාරින්ගෙන් සමන්විත මැදිහත්කරුවන් හෙවත් සජීවීකරුවන් පිරිසක් බිහිකර ගැනීම, සහාය සේවා පද්ධතිය තුළ දිළිඳුකම පිටු දැකීමේ අරමුණට සංවේදි නැඹුරුවක් ඇති කිරීම, අඩු ආදායම්ලාභින් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගැනීම ඔවුන් තුළින් සිදුවන ගිළිහී යාම් අවම කිරීම, ඔවුන් සතු විභව ශක්තීන් මතු කර ගැනීම හා සාමුහිකත්වය ගොඩනැගීම (කුඩා කණ්ඩායම් /ග්‍රාමීය සංවිධාන) සිදු කළ යුතුය.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන තුළ වසම් මට්ටමේ නිලධාරින්ට පුහුණුකරුවන් කණ්ඩායමක් ලෙස ගම විමර්ශනය කිරීමට, පුහුණුකරුවන්ට හා ග්‍රාමීය ප්‍රජාවට, එක්ව ගමේ යථා ස්වභාවය තේරුම් ගැනීමට, තොරතුරු විශ්ලේෂණය කරමින් විග්‍රහ කරමින් පවතින ආර්ථික හා සමාජ ක්‍රියාවලියේ වර්තමාන

තත්ත්වය හා ඉදිරි සංවර්ධන දිශානතීන් හඳුනා ගැනීමට, ඒකාබද්ධ ප්‍රවේශය තුළ (රජය/පෞද්ගලික අංශය/සිවිල් සමාජය) ක්‍රියාවට නැගෙන ශක්තිමත් කාර්යබද්ධ වැඩපිළිවෙළකට මූලික අත්තිවාරම සැකසීම අත්‍යවශ්‍ය වේ.

**ගම යනු සංවර්ධන ඒකකයකි. ස්ත්‍රී- පුරුෂ, ළමා තරුණ වැඩිහිටි, අඩු /මධ්‍යම/ ඉහළ ආදි වශයෙන් වූ විවිධ ආදායම්ලාභීන්, ජීවනෝපාය මාර්ග හඳුනාගත් නොගත්, සාර්ථක හා අසාර්ථක ජීවන අත්දැකීම් ඇති, තමා සතු විභව ශක්තීන් හඳුනාගත්/නොගත්, විවිධ අධ්‍යාපන මට්ටම්වලින් සමන්විත, සමාජ අසාධාරණයට ලක්වූ හා නොවූ/ ධනාත්මක / ඍණාත්මක සිතිවිලිවලින් සමන්විත, සුළු ණය ක්‍රියාවලිය තුළ ණය උගුලකට හසුවූ, විවිධාකාර වූ ප්‍රජා සංවිධාන වල තනතුරු හා සමාජිකත්වය දරණ නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධයෙන් අසාධාරණයට ලක්වූ සංවර්ධනය සම්බන්ධයෙන් සුභවාදි හා අසුභවාදි අත්දැකීම් සහිත ප්‍රජාවක් ජීවත්වන සංවර්ධන ඒකකයකි. භෞතික හා මානව සම්පත් වලින් සමන්විත වේ. විවිධ නම් වලින් හඳුන්වනු ලබන ප්‍රජා සංවිධාන ජාලයකින් සමන්විත නිර්මාණයකි. එසේම විපරිනාමයට පත් වන සමාජ ව්‍යුහයකි. මෙවැනි ගමකට සංවර්ධන සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම, ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශය තුළ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.**

---

සාම්ප්‍රදායික සංවර්ධන පුහුණු ක්‍රමවේදය හා සලකා බලන කළ විපර්යකාරක පුහුණු ක්‍රමවේදය කාලීන, විප්ලවීය හා ජනතාවාදි නව චින්තනයක් ඔස්සේ ප්‍රායෝගික ක්‍රියාවලියක් තුළින් බිහිවූ පුහුණු ක්‍රමවේදයකි. ගතවූ කාල පරිච්ඡේදය තුළ විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන රැසක් තම සංවර්ධන පුහුණු ක්‍රමවේදය ලෙස මෙය භාවිතා කර තිබීම මෙහි යෝග්‍යතාව මැනවින් ප්‍රකට කරන්නකි. සාර්ක් කලාපීය රටවල් දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් වලදී මෙම පුහුණු ක්‍රමවේදය අත්‍යවශ්‍ය මෙවළමක් ලෙස භාවිතයට ගැනීමත්, දිළිඳු රටවලට ආධාර සපයන බොහෝ ජාත්‍යන්තර ආයතනද මෙම පුහුණු ක්‍රමවේදය පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමු කොට ක්‍රියාත්මක කළ බව සංවර්ධන වැඩසටහන් තුළින් ප්‍රකට කෙරේ. එසේම බොහෝ සංවර්ධන ව්‍යාපෘතිවල පුහුණුව මෙවලමක් ලෙස භාවිතයට ගෙන ඇත. එහෙත් විපර්යකාරක වැඩසටහනේ සංවර්ධන ක්‍රියාවලිය ජනිත වන්නේ පුහුණුව තුළිනි. පුහුණුව හා සංවර්ධන ක්‍රියාවලිය බද්ධව දැකිය නොහැක. එය ඒකාබද්ධව ක්‍රියාත්මක වේ.

ඒකාබද්ධ ගම් සංවර්ධන වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නම් වර්තමාන ගම තුළ පවත්නා සමාජ ආර්ථික රටාව තියුණු අන්දමින් විග්‍රහ කිරීමට හැකියාව ඇති විශ්ලේෂණාත්මක ප්‍රබුද්ධ පුද්ගලයෙක් ලෙස ප්‍රජාව සමඟ කටයුතු කරන නිලධාරියා ගොඩනැගිය යුතුය. එසේම ප්‍රජාවගේ විවිධ වූ පුද්ගල

මනෝභාවයන්/ චර්යා රටාවන් හඳුනා ගැනීමටත්, විවිධ උපාය මාර්ගයන් ඔස්සේ ප්‍රජාවගේ චර්යා රටාවේ වෙනස්කම් ඇතිකරලීමටත් හැකියාව ඇති මානව හිතවාදී පුද්ගලයෙක් ගොඩනැගීමේ විභවතාවයක් මෙම ක්‍රමවේදය සතුව ඇත.

එබැවින් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ගළපාගනිමින් සංවාදශීලි පුහුණු පරිසරයක් තුළ මැදිහත්කරුවෙකු ගොඩනැංවීමේ ක්‍රියාවලිය සිදු කළ යුතුය. එහිදී තමාගේ උගත්කම බහුශ්‍රැතභාවය හුවා නොදක්වන, තමා දන්නා න්‍යායන් හා සංකල්ප පුහුණුලාභීන් තුළට පැටවීමට උත්සාහයක නොයෙදෙන, ගුරුවරයෙකු / දේශකයෙකු/ උපදේශකයෙකු/අණකරන්නෙකු වැනි කිසිදු චරිතයක රැඳී නොසිටින, පුහුණුලාභින් චර්යාමය වෙනසකට ලක් කිරීමට හැකි සම්පත්දායක කණ්ඩායමකගේ සහාය ඇතිව පුහුණු කටයුතු සිදු කිරීම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ තිරසරභාවය ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.



ඩී.ඒ.පී.දාස්වත්ත
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
පිළිමතලාව

## “පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්” යථාර්ථයක් බවට පත්කරගැනීමට ප්‍රජාවේ ආකල්ප කෙසේ සකස් විය යුතුද?

පොහොසත් රටක ලස්සන ජීවිත ගත කරන ප්‍රජාවක් නිර්මාණය කරගැනීමට රට තුළ **තිරසාර සංවර්ධන ක්‍රියාවලියක්** ස්ථාපිත කරගැනීම අනිවාර්ය වේ. සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව ආර්ථික දේශපාලන සහ සාමාජීය වශයෙන් වූ අභියෝග රාශියකට මුහුණ දෙමින් සිටී. තිරසාර සංවර්ධන ක්‍රියාවලියකදී රටකට ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ, යටිතල පහසුකම් සංවර්ධනය සහ විදේශීය ආයෝජන වැනි දෑ තීරණාත්මක සාධක වේ. නමුත් පුරවැසියන්ට ලස්සන ජීවිතයක් උදාකරලීමට **අර්ථවත් සමාජ සංවර්ධනයක්** ද සමගාමීව සිදුවිය යුතුය. බොහෝ විට සංවර්ධන ක්‍රියාවලින්වලදී එයට ප්‍රධාන උත්ප්‍රේරකයක් වන “**ජනතාවගේ ආකල්ප**” නොසලකා හැරීමක් සිදුවන බවක් දක්නට ඇත. සමාජමය පරිවර්තනයක් සිදුකිරීමේදී ප්‍රජාව නිසි මානසිකත්වයක් තුළ පිහිටුවීම අවශ්‍ය වනවාක් මෙන්ම අදාළ පරිවර්තනයේ තිරසාරභාවය පවත්වාගැනීමටද එය අත්‍යවශ්‍ය සාධකයක් වේ. එබැවින් තිරසාර සංවර්ධන ක්‍රියාවලියකදී අවශ්‍ය වන **සමස්ත සමාජ සංවර්ධනය** සහතික කිරීම සඳහා ප්‍රජාව අතර වගා කලයුතු ප්‍රධාන ආකල්ප මොනවාද? ඒවා ප්‍රවර්ධනය කිරීමට අනුගමනය කළ හැකි උපාය මාර්ග මොනවාද? එසේ යහපත් හා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනයෙන් රටකට හා එහි ප්‍රජාවට කුමනාකාර වාසි සහගත තත්ත්වයන් උදාකර දෙනු ලබන්නේද? යන්න මෙම ලිපියෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.



### 01. සාමූහික වගකීම සහ සිවිල් සහභාගීත්වය (Collective Responsibility and Civic Engagement)

ශක්තිමත් සාමූහික වගකීමේ හැඟීමක් පුරවැසියන් තුළ පැවතීම තිරසාර සමාජ සංවර්ධන ක්‍රියාවලියකදී ඉතා වැදගත් සාධකයක් වේ. ප්‍රජාව වෙත ප්‍රාදේශීය පාලනයට සහභාගී වීමේ අවස්ථාව පැවතීම, නායකයින්

වගකීමට පත් කිරීම, ප්‍රජා සංවර්ධනය සඳහා ස්වේච්ඡා සේවය, වැනි තත්ත්වයන්ට දිරිදීම මගින් සාමූහික වගකීමේ ආකල්පය ප්‍රවර්ධනය කලහැකි වේ. පරිසර ගැටළු, මත් ද්‍රව්‍ය උවදුර, සනීපාරක්ෂාව පිළිබඳ ගැටළු, පාසල් හැරයාම, වංචා හා දූෂණ ක්‍රියාවන්, කෘෂිකර්මාන්තයේ පවතින ගැටළු, වන සත්ව හානි, විරැකියාව හා දිළිඳුකම, ආයතන වල පවතින අකාර්යක්ෂමතාවය වැනි ප්‍රජා ගැටළු පොදු හවුල් වගකීම් ලෙස පුරවැසියන් දකින විට, ඔවුන් රජයේ විසඳුම් ලැබෙන තුරු නිෂ්ක්‍රියව බලා නොසිට වඩා නිර්මාණශීලී හා ප්‍රායෝගික, කාර්යක්ෂම විසඳුම් සොයා ගැනීමටත් එම විසඳුම් සමග ක්‍රියාත්මක වීමට අවශ්‍ය ස්වයං අභිප්‍රේරණයක් ඇති කිරීමටත් හැකියාව පවතී.

**02. ඉවසීම සහ සමාජ සහයෝගීතාවය (Tolerance and Social Cohesion)**

ශ්‍රී ලංකාවේ මෙන්ම බොහෝ දියුණු වෙමින් පවතින රටවල ජනවාර්ගික, ආගමික මෙන්ම සංස්කෘතික විවිධත්වයන් පවතී. මෙවැනි වූ විවිධත්වයන්ට වටිනාකම් දෙන හා සමානාත්මතාවය පිළිබඳ ආකල්පයන් ප්‍රජාව තුළ පැවතීම සාමය සහ එකමුතුකම දිරිමත් කරයි. මෙම තත්ත්වය තිරසාර සංවර්ධන ක්‍රියාවලියකට අත්‍යවශ්‍ය සාධකයක් වන බව අප රට දෙස බැලුව ද පෙනේ. මෙවැනි වෙනස්කම් තුළ අන්‍යෝන්‍ය ගෞරවය සහ සංවාදය ප්‍රවර්ධනය කිරීමෙන් ගැටුම් අඩුකරන අතර පීඩනයන්ට ඔරොත්තු දිය හැකි ශක්තිමත් සමාජ රටාවක් ගොඩනැංවීමට හැකියාවක් ලැබේ.

**03. වැඩකිරීමේ මනෝභාවය සහ නවෝත්පාදනය ( Work Ethic and Innovation)**

නවීකරණය වන ලෝකයේ **ඉල්ලුමට අනුගතවීම** ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට ඉතා වැදගත් වේ. වෙහෙස මහන්සියෙන් වැඩ කිරීම, ස්වයං විනය පවත්වා ගැනීම, අඛණ්ඩ ඉගෙනීම තුළින් පුද්ගල සංවර්ධනය වැනි කාරණාවලට වටිනාකම් දෙන ආකල්පයන් ප්‍රජාව තුළ පැවතීම එකී ලෝක ඉල්ලුමට අනුගතවීමට අවශ්‍ය නිෂ්පාදන ක්‍රියාවලියට උපකාරී වේ. මෙහිදී තරුණ තරුණියන්ගේ ව්‍යවසායකත්වය, වෘත්තීය කුසලතා හා නවෝත්පාදනය මෙන්ම පෞරුෂ සංවර්ධනය ද දිරිමත් කිරීම ආර්ථික හා සමාජ සංවර්ධනයට මනා පිටු බලයක් සපයයි. තවද මෙමගින් බාහිර හෝ රජයේ අධාර මත යැපීම අඩුකරන අතරම **ස්වයං විශ්වාසී ප්‍රජාවක්** බිහි කිරීමට ඉවහල් වේ.

**04. නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම හා අඛණ්ඩතාවය (Respect for Rule of Law and Integrity)**

**05.** නීතියේ ආධිපත්‍ය නොමැති රටකට සංවර්ධනය හෝ සමාජ සංවර්ධනය සාර්ථක කරගැනීමට අපහසු වේ. වංචා හා දූෂණ ක්‍රියා, අක්‍රමිකතා මෙන්ම අවනීතිය රජයන සමාජයක් තුළ පීඩනයට පත් පුරවැසියන්ට ලස්සන ජීවිතයක් කොහෙත්ම උරුම නොවේ. සමාජයේ සෑම අංශයකම අවංක භාවය සහ

සදාචාරාත්මක හැසිරීම් රටාවන්ට ගරු කරන **සංස්කෘතියක්** නිර්මාණය වීමට නීතියේ ආධිපත්‍යයට ගරු කිරීමේ ආකල්පයන් ප්‍රජාව තුළ ප්‍රවර්ධනය විය යුතු වේ. මෙමගින් පාලන තන්ත්‍රය හා ආයතන ව්‍යුහය කෙරෙහි ප්‍රජාවගේ විශ්වාසය ගොඩනැගීම මෙන්ම එහි ස්ථාවරත්වය ද දිරිමත් කරයි. අයිතිවාසිකම්, වගකීම් හා යුතුකම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සහ සෑම මට්ටමකදීම විනිවිදභාවය පවත්වා ගැනීම දිරිගැන්වීම තුළින් මෙවැනි ආකල්ප ප්‍රජාව තුළ ප්‍රවර්ධනය වන අතර එයින් දිගුකාලීන තිරසර සමාජ සංවර්ධනයට මාර්ගය විවර කරයි.

**06. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ ඇතුළත් කිරීම (Gender Equality and Inclusion)**

සැබෑ සමාජ සංවර්ධනයකදී ප්‍රජාවේ කිසිදු කණ්ඩායමක් පිටුපසින් සිටිය යුතු නොවේ. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ආකල්පය ද, විවිධ හේතූන් මත වෙන් කරන ලද ප්‍රජාවන් ඇතුලත් කර ගැනීම ද, ප්‍රවර්ධනය කිරීම තුළින් ජනගහනයේ සම්පූර්ණ හැකියාවම භාවිතයට ගැනීම සහතික කරයි. කාන්තාවන්ගේ අධ්‍යාපනය, නායකත්වය හා ආර්ථික සහභාගීත්වය කෙරෙහි පවතින දුර්වල ආකල්ප වෙනස් කිරීම තුළ පවුල්වල මෙන්ම සමාජයේ ද යහපැවැත්ම සහතික කරයි.

**07. පරිසර සවිඥානතාව (Environmental Consciousness)**

රටක සංවර්ධන ක්‍රියාවලියේදී කාර්මිකකරණය මෙන්ම නාගරිකකරණය ද අවශ්‍යයෙන්ම සිදු වේ. මෙහිදී පාරිසරික තත්වයන්ට එරෙහිව සිදු කරනු ලබන අහිතකර බලපෑම් අවම කරගැනීමට කටයුතු කිරීමට සිදු වේ. එහිදී අපද්‍රව්‍ය කළමනාකරණය, ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලි, කෘෂිකර්මාන්ත භාවිතයන්ගේ අහිතකර තත්වයන් මෙන්ම ගස් සිටුවීම හා ස්වභාවික වනාන්තර ආරක්ෂා කිරීම, ජල දූෂණය, වායු දූෂණය, ශබ්ද දූෂණය වැනි දෑ පිළිබඳව තමන් වගකිව යුතුයි යන ආකල්පයක් ප්‍රජාව තුළ පැවතීම යෝග්‍ය වේ. එමෙන්ම අනාගත පරම්පරාවන් සඳහා ද ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමට සහ සෞඛ්‍යාරක්ෂිත ජීවන තත්වයක් පවත්වා ගැනීමට උපකාරී වීමත් මෙවැනි ආකල්පයන් ප්‍රජාව තුළ ප්‍රවර්ධනය කිරීමෙන් සිදු වේ.

**08. ශුභ වාදය සහ බලාපොරොත්තුව (Optimism and Hope)**

සමාජ සංවර්ධනයේදී ප්‍රජාවේ ශුභවාදී මානසික තත්වය වැදගත් සහ අවශ්‍ය වේ. වෙනසක් සිදුකල යුතු බවත්, එය සිදුවිය හැකි බවත්,ඊට ඔවුන්ගේ උත්සාහය අවශ්‍ය බවත් ප්‍රජාව විශ්වාස කල යුතු වේ. බලාපොරොත්තුවෙන් යුතු සමාජයක් වඩාත් ධෛර්යශීලී, අත්හදා බැලීමට වඩාත් කැමැත්තක් ඇති ප්‍රජාවක්, රටක සංවර්ධනයේ මූලයන් සමග සක්‍රීයව සම්බන්ධ වීමට වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය කරයි. සංවර්ධනය යනු හුදෙක් ප්‍රතිපත්ති සහ යටිතල පහසුකම් වලම පමණක් වන කාරණයක් නොව එය ජනතාවගේ **ආකල්ප සහ හැසිරීම්** වල ගැඹුරින් මුල් බැසගත යුතු සංසිද්ධියකි. එකමුතුකම, වගකීම,

නවෝත්පාදනය සහ සමාජ ඇතුළත් කිරීම පිළිබඳව ධනාත්මක සුභවාදී ආකල්ප ප්‍රජාව තුළ ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට ඉතා අවශ්‍ය වේ. මෙහිදී ප්‍රජාවට තමන්ම ඇතුලතින් වෙනස්කර ගැනීමට අවස්ථාව උදා කරදීමත් එහි වටිනාකම අවබෝධ කරදීමත් ඉතා වැදගත් වේ. මෙවැනි ආකල්ප ප්‍රජාවක් තුළ පැළ කිරීම ඉක්මන් ක්‍රියාවලියක් නොවන අතර අධ්‍යාපනය, නායකත්වය සහ අඛණ්ඩ උත්සාහයත් සමග එය වඩාත් ශක්තිමත් කර ගැනීමට අවස්ථාව උදා කරගත හැකි වනු ඇත. නිවැරදි ආකල්පයන් වර්ධනය කිරීම සහ එහි තිරසාර ප්‍රගතියක් සාක්ෂාත් කර ගැනීමට අනුගමනය කළ හැකි ප්‍රධාන උපාය මාර්ගයන් කීපයක් පවතී.

- **අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (Education Reform)**

සදාචාරය, සහයෝගීතාවය, පුරවැසි වගකීම් සහ යුතුකම්, පරිසරය සුරැකීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සහකම්පනය වැනි දෑ සම්බන්ධයෙන් වටිනාකම් පදනම් කරගත් විෂය මාලාවන් හා ක්‍රියාකාරකම් හඳුන්වාදීම මේ යටතේ සිදුකල හැකිය. යැපීමට වඩා නවෝත්පාදනය සහ වගකීම්කරණ මනෝභාවයන් පෝෂණය කිරීමට උචිත විවේචනාත්මක චින්තනය සහ ගැටළු විසඳීමේ කුසලතාවයන් ඔප් නැංවීමට සුදුසු ක්‍රියා පිළිවෙත් ද අනුගමනය කල හැකි වේ. තවද අයිතිවාසිකම් වගකීම් හා ප්‍රජා සහභාගීත්වයේ වැදගත්කම පුරවැසි අධ්‍යාපන ක්‍රියාවලියේදී අනුගමනය කල හැකි වේ.

- **ප්‍රජා සම්බන්ධීකරණය සහ සවිබලගැන්වීම (Community Engagement and Empowerment)**

සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම, තරුණ කණ්ඩායම් හා කාන්තාවන් සවිබල ගැන්වීම හා එහිදී නායකත්ව අවස්ථා මෙන්ම ඉලක්කගත සහායන් ලබා දීම , ධනාත්මක හැසිරීම හා ආකල්පමය වෙනස්කම් ඇතිකිරීම සඳහා බලපෑම් කිරීමට සුදුසු ප්‍රජා නායකයින් ආදර්ශ ලෙස භාවිතා කිරීම වැනි දෑ සිදුකල හැකි වේ.

- **සංස්කෘතික හා මාධ්‍ය බලපෑම (Cultural and Media Influence)**

එකමුතුකම, ධනාත්මක සිතුවිලි, නිර්මාණශීලී චින්තනයට උපකාරීවන දෑ, සහකම්පනය, ව්‍යවසායකත්වය, වැනි යහපත් ආකල්ප වල වටිනාකම් ගුවන් විදුලිය, රූපවාහිනි, හා සමාජ මාධ්‍යවල ප්‍රවර්ධනය වීම මෙහිදී වැදගත් වේ. ධනාත්මක සමාජ වටිනාකම් ශක්තිමත් කරන ගීත, චිත්‍රපට, රංග කලා මෙන්ම සහිත්‍යමය නිර්මාණ භාවිතය සුදුසු වේ. එමෙන්ම ව්‍යාජ තොරතුරු හා හානිකර සම්ප්‍රදායන් සමාජගත කරන ප්‍රතිගාමීත්වයට එරෙහිව සටන් කිරීමට මාධ්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය ද ඉතා වැදගත් වේ.

- **නායකත්වය සහ ආදර්ශ දැක්වීම (Leadership and Role Modeling)**

රජයේ හා ආයතන වල අඛණ්ඩභාවය, විනිවිදභාවය මෙන්ම ප්‍රජාව වෙත සහයෝගී සේවය ප්‍රවර්ධනය වීම සඳහා සදාචාරාත්මක නායකත්වයක් අවශ්‍ය වේ. සමාජයේ වෙසෙන ජනප්‍රිය හා ප්‍රබල පුද්ගලයින් අපේක්ෂිත වටිනාකම් අනුගමනය කරන ආදර්ශකරුවන් වීමේ අවශ්‍යතාවය දිරිමත් කිරීම සුදුසු වේ. සමාජ සංවර්ධනයට ධනාත්මක ලෙස දායක වන පුද්ගලයින් සහ කණ්ඩායම් ඉස්මතු කිරීම හා පිළිගැනීමට ලක් කිරීම ද කල යුතු වේ.

- **ප්‍රතිපත්ති සහ ආයතනික සහාය (Policy and Institutional Support)**

මෙහිදී සමානාත්මතාවය, යුක්තිය සහ සහයෝගීතාවයට උපකාරී වන නීතිමය රාමුවන් සහ ප්‍රතිපත්ති සම්පාදනය සිදුකල හැකිය. ජනතා විශ්වාසය දිනාගැනීමට කාර්යක්ෂම, විනිවිදභාවයෙන් සහ වගකීම් කරණය සහිත ආයතනික ව්‍යුහයන් ගොඩනැගීම ද කල හැකිය. සමාජ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අවශ්‍ය ආකල්පයන් ප්‍රවර්ධනය සඳහා වන සමාජ සංවිධානගත කිරීම් හා ඒ සඳහා වන ව්‍යුහයන් දිරිමත් කිරීම වැදගත් වේ.

- **ආගමික සහ සදාචාරාත්මක සම්බන්ධීකරණය (Religious and Ethical Engagement)**

මෙහිදී සදාචාරාත්මක හැසිරීම සහ ප්‍රජා සහයෝගීතාව ප්‍රවර්ධනය සඳහා ආගමික නායකයින් සමග එක්ව කටයුතු කල හැකිය.අන්තර් ආගමික සංවාද හරහා විවිධ ආගමික කණ්ඩායම් අතර සාමය, සමගිය, නිදහස හා අන්‍යෝන්‍ය ගෞරවය දිරිමත් කිරීම ද කල හැකි වේ.

- **තරුණ සම්බන්ධීකරණය සහ ධාරිතා සංවර්ධනය. (Youth Engagement and Capacity Building)**

කුසලතා සංවර්ධන වැඩසටහන් මගින් තරුණ ප්‍රජාව වෙත ජීවන කුසලතා සහ ව්‍යවසායක චින්තනය ලබාදීම සඳහා සංවිධානගත කරගැනීම සිදුකල හැකි වේ. එමෙන්ම ස්වේච්ඡා සේවය සහ සේවා අධ්‍යාපනය සඳහා ද පෙළඹවීම් ඇති කල හැකිය.

- **අධීක්ෂණය සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ (Monitoring and Feedback Mechanisms)**

මෙහිදී හැසිරීම් සමීක්ෂණ සහ සමාජ විගණන මගින් පොදු ආකල්ප සහ සමාජ හැසිරීම්වල වෙනස්කම් නිරීක්ෂණය කිරීම කල හැකිය. ධනාත්මක හැසිරීම ශක්තිමත් කරමින් ජනතාවට ඔවුන්ගේ සහභාගීත්වයේ ප්‍රතිඵල අත්දැකීමට ඉඩ ලබා දීම කල හැකි වේ.

ඉහත සාකච්ඡා කළ උපාය මාර්ගයන් මගින් රටේ සාමූහික ප්‍රගතිය සඳහා ප්‍රජාව තුළ නිවැරදි මනෝභාවයන් ප්‍රවර්ධනය කිරීම කල හැකිය. එමෙන්ම එම තත්වය කාලයක් පුරා පවත්වාගෙන යාමද අවශ්‍ය වේ. මෙසේ ප්‍රජාවේ ආකල්ප, වටිනාකම් සහ හැසිරීම් හැඩගස්වා ගැනීම තුළ රටක සමාජ සංවර්ධනය ළගා කර ගැනීමට අවශ්‍ය සාධක ප්‍රතිඵල ලෙස ලැබේ.

- **සමාජ සම්බන්ධතාව සහ එකමුතුකම ප්‍රවර්ධනය කරයි. (Promotes Social Cohesion and Unity)**

එකමුතුකම සමාජ සංවර්ධනයේ **පදනම් මූලධර්මයකි**. පුද්ගලයන්ගේ ඉවසීම, සහකම්පනය සහ සහයෝගීතාවයේ ආකල්ප ප්‍රවර්ධනය වන විට ජනවාර්ගික, ආගමික සහ දේශපාලනික වෙනස්කම් මත ඇතිවන සමාජ බෙදීම් අඩු වීමට පටන් ගනී. විවිධ කණ්ඩායම් පොදු ඉලක්ක සඳහා එක්ව වැඩකරන වඩාත් **අන්තර්කරණය වූ පරිසරයක්** නිර්මාණය කරයි. ගැටුම් අඩුකර සාමය ප්‍රවර්ධනය කරයි. මෙය සංවර්ධන ක්‍රිවලියේදී අත්‍යවශ්‍ය වන ඉතා වැදගත් කොන්දේසියකි.

- **සිවිල් වගකීම වැඩිදියුණු කරයි. (Enhances Civic Responsibility)**

ජාතික සංවර්ධනය කෙරෙහි වන ධනාත්මක ආකල්පයන් ප්‍රජාව තුළ පැවතීම ඒ සඳහා ඔවුන්ගේ සක්‍රීය සහභාගීත්වය ධෛර්යමත් කිරීමට හේතු වේ. පුරවැසියන්ට තම සමාජය සඳහා වගකීමක් ඇති බව දැනෙන විට ඔවුන් ස්වේච්ඡා සේවයට, දූෂණය වාර්තා කිරීමට, දේශපාලන වෙනස්කම් වෙනුවෙන් වැඩ කිරීමට යනාදී දේ සඳහා එකතු වීමට වැඩි අවස්ථාවක් නිර්මාණය කරයි. මෙම අයිතිකාරීත්ව හැගීම මගින් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ප්‍රවර්ධනය කර නායකයින් වගකිවයුතු කරයි. වඩා හොඳ පාලනයක් වෙනුවෙන් මාර්ගය පාදා දෙනු ඇත.

- **නවෝත්පාදනය සහ ගැටළු විසඳීම දිරිමත් කරයි. (Encourages Innovation and Problem-Solving)**

ප්‍රගතිය, ඉගෙනීම සහ ඔරොත්තුදීම කෙරෙහි යොමු වූ මනෝභාවයන් වඩාත් පරිවර්තනාත්මක විය හැකිය. වෙනසක් ඇති කිරීමට තමන්ගේ ධාරිතාවය පිළිබඳ විශ්වාස කරන පුද්ගලයන් ගැටළු සඳහා නව්‍ය විසඳුම් සෙවීමට වැඩි ප්‍රවනතාවයක් දක්වයි.එමෙන්ම ප්‍රජාවක් තුළ ක්‍රියාශීලී හා ව්‍යවසායකත්ව ආකල්ප පැවතීම දරිද්‍රතාවය, විරැකියාව, දේශගුණ විපර්යාස වැනි ගැටළු සඳහා දේශීය විසඳුම් සැකසීමට උපකාරී වේ.

- **දූෂණය අඩුකර වගකීම වැඩිකරයි. (Reduces Corruption and Increases Accountability)**

සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රගතියට, දූෂණය විශාල බාධකයක්ව පවතී. අවංකභාවයේ හා විනිවිදභාවයේ ආකල්ප වර්ධනය කිරීම හේතුවෙන් අනීතික හැසිරීම් තවදුරටත් නොඉවසන සංස්කෘතියකට මග පෙන්වනු ඇත. පුරවැසියන් සදාචාරික වගකීම අගය කරන විට මහජන විශ්වාසය වර්ධනය වන අතර මෙය රාජ්‍ය සේවා සැපයීමේදී වඩාත් ඵලදායී වනු ඇත.

- **අධ්‍යාපනය සහ ජීවිත කාලීන ඉගෙනීම සඳහා සහාය දක්වයි. (Supports Education and Lifelong Learning)**

අධ්‍යාපනය හුදෙක් රැකියාවක් ලබා ගැනීමේ මාධ්‍යයක් ලෙස නොව සවිබල ගැන්වීමේ මෙවලමක් වශයෙන් වූ ආකල්පයක් සමාජගත වීම, දැනුම හා කුසලතා සංවර්ධනයට සමාජය තුළ අගය කිරීමක් පැවතීම, අධ්‍යාපනයට වැඩි ආයෝජනයක් කිරීම, වැනි තත්වයන් මත ප්‍රජාවේ සියළුම වයස් කණ්ඩායම් තුළ **අඛණ්ඩ ඉගෙනුමට** ධෛර්යයක් සපයනු ඇත.

- **ප්‍රජා ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කරයි. (Strengthens Community Resilience)**

ස්වභාවික ආපදා, රෝග, ආර්ථික පිරිහීම, දේශපාලන අස්ථාවරත්වය, වැනි හේතූන් මත හටගන්නා අර්බුද කාලවලදී ශුභවාදීත්වය, ධෛර්ය සහ අනුගත වීම වැනි ධනාත්මක ආකල්ප ඉතා වැදගත් වේ. ඔරොත්තු දීමේ මනෝභාවයකින් යුතු ප්‍රජාවකට කම්පනයන්වලට හොඳින් ඔරොත්තු දීමටත් ඉක්මනින් යථාතත්වයට පත්වීමටත් හැකියාව ඇත. මෙවැනි තත්වයක් සමාජ සංවර්ධනයේ තිරසාරභාවය සහතික කරයි.

- **ශක්තිමත් ආයතන ගොඩනගයි. (Builds Stronger Institutions)**

සමෘද්ධිමත් ආයතන පද්ධතියක පැවැත්ම සඳහා නීතිගරුක, යුක්තිය ඉල්ලා සිටින සහ මහජන කතිකාවකට ධනාත්මකව දායක වන පුරවැසියන්ගේ සහාය අවශ්‍ය වේ. අධිකරණ සහ පරිපාලන පද්ධති සඳහා විශ්වාසය වර්ධනය කිරීමට සාධාරණත්වය සහ යුක්තිය අගය කරන මනෝභාවයතින් යුතු ප්‍රජාවක් විසීම වැදගත් වේ. මෙතුළින් ප්‍රජාව වෙත කාර්යක්ෂම සහ සාධාරණ ලෙස සේවයකරන ආයතන ස්ථාපිත කිරීමට උපකාරී වනු ඇත.

සංවර්ධන ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය සඳහා භෞතික සම්පත් හා ප්‍රතිපත්තිමය රාමු වැදගත් වනවා සේම **ප්‍රජාවේ සාමූහික ආකල්ප** ද වැදගත් වේ. අප රට වැනි රටවල සම්පත් සීමිත වන අතර අභියෝගයන් ද සංකීර්ණ ස්වරූපයක් ගනී. මෙවැනි අවස්ථාවක ප්‍රජාව තුළ **නිවැරදි ආකල්ප** වර්ධනය කිරීම, අර්ථවත් සහ තිරසාර සමාජ ප්‍රගතිය සඳහා වඩාත් ප්‍රමුඛ වූ **උත්ප්‍රේරකය** වේ. ආණ්ඩුව, අධ්‍යාපනවේදීන්, ආගමික නායකයන් හා ජන මාධ්‍ය මෙම ආකල්ප හැඩගැස්වීමේ තීරණාත්මක කාර්යභාරය ඉටු කරන බව පෙනේ. අප රටේ ප්‍රජාව ධනාත්මක හා නිවැරදි ආකල්ප වලින් යුතු මනෝභාවයකින් පිහිටු වීමෙන් පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් යන රජයේ වර්තමාන ප්‍රතිපත්තිය කඩිනමින් යථාර්ථයක් බවට පත්කිරීමේ හැකියාව ඇත.

කේ.බී. ධර්මප්‍රිය
සංවර්ධන නිලධාරී
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
පිළිමතලාව

# සෝජාන් වගාව

ශ්‍රී ලංකාවේ රජය විසින් ප්‍රකාශයට පත්කළ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තේමා පාඨය වන පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ලහාකර ගැනීම සඳහා දේශපාලනය, රාජ්‍ය අංශය හා ප්‍රජාව යන අංශ තුනම ඉතා කැපවීමෙන් හා උත්සාහයෙන් යුතුව කටයුතු කළ යුතුවේ. එක් අංශයක් පමණක් කෙතෙක් කැපවීමෙන් කටයුතු කළද පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කරා ලඟා වීමට පහසු නොවේ.

මේ සඳහා ප්‍රජාව තුළ ආර්ථික ශක්තිය වර්ධනය කළයුතුය. අතීතයේ සිටම ලංකාව කෘෂිකාර්මික රටක් වන අතර කෘෂිකර්මාන්තය ප්‍රජාවගේ ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් ලබා දී ඇත. එබැවින් කෘෂිකර්මාන්තය සම්බන්ධ නව අත්හදා බැලීම් මෙන්ම ප්‍රජාවට හුරු පුරුදු පාරම්පරික කෘෂි කර්මාන්තයේ අංගද, නවීන තාක්ෂණයද යොදා ගෙන කෘෂිකර්මාන්තය වර්ධනය කර ගැනීම කාලෝචිත වී ඇත. පාරම්පරික කෘෂි කර්මාන්තයේ අංග මෙන්ම නවීන තාක්ෂණයද සංකලනය වූ වගා ක්‍රමයක් ලෙස සෝජාන් වගා ක්‍රමය හැඳින්විය හැක. මෙවන් ක්‍රම රාජ්‍ය අංශ විසින් ප්‍රජාවට හඳුන්වා දීමත්, දේශපාල අංශයේ සහයෝගයත් මත ප්‍රජාව ගොවිතැන සඳහා යොමු කිරීමෙන් රජය විසින් ප්‍රකාශයට පත්කළ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන තේමාව ඉටු කර ගැනීමට පහසුවනු ඇත.

සෝජාන් වගා ක්‍රමය යනු ඉන්දුනිසියාවේ ජනතාව විසින් භාවිතා කරන සාම්ප්‍රධායික වගා ක්‍රමයකි. විශේෂයෙන් වගා කළ නොහැකි ඉඩම් ආහාර බෝග වගාව සඳහා යොදා ගැනීමට මෙම සෝජාන් ක්‍රමය උපයෝගී කර ගනී.

වගා කළ නොහැකි ඉඩම් වශයෙන් සැලකෙන්නේ හේතු කිහිපයක් නිසාවෙනි. ගංවතුරට ලක් වීමෙන් ජලය බැස නොයාම නිසා වගාවට සුදුසු නොවීම මෙන්ම වගුරු බිම් හා අධික ලවණතාවයෙන් යුත් ඉඩම් වගාවට යොදා ගැනීමට හැකියාවක් නොතිබීම නිසා බොහෝ විට ඒවා පුරන් ඉඩම් බවට පත් වෙයි.

අප රටේ වගා කළ නොහැකි හා වගා නොකර පුරන්වීමට ඉඩ හැර ඇති කුඹුරු ප්‍රමාණය දෙස බලන විට භූමි පරිහරණයට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. මෙරට ඉඩම් පරිහරණ රටාවේ මෑත කාලීන ප්‍රවණතාවන් දෙස බලන විට බස්නාහිර පළාතේ කුඹුරු බිම් විශාල ප්‍රමාණයක් වී වගාව සඳහා යොදා නොගැනීම කැපී පෙණෙන කරුණකි. ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්ත අනුව 2018 වර්ෂය වන විට මුළු දිවයින පුරා කුඹුරු හෙක්ටෙයාර් 40,356 ක් පුරන්වීමට අත්හැර දමා තිබේ. මෙම ඉඩම්වලින්

බහුතරයක් ජලය විධිමත් පරිදි බැහැර නොවීම, මෙන්ම මිනිස් ශ්‍රමය සොයා ගැනීමේ අපහසුතාව, හා වියදමට සරිලන අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි වීම ද කැපී පෙනෙන කරුණකි.

බස්නාහිර පළාතේ බොහෝ පුරන් කුඹුරු ඉඩම්වල අයිතිකරුවන් වන්නේ පාරම්පරිකව යම් ධනයක් උපයාගෙන ඇති පවුල්ය. එම පවුල්වල බොහෝ දෙනෙක් රට අතහැර ගොස් වෙනත් රටවල ජීවත් වන අතර එම රටවල විවිධ රැකියාවල ද නියුතු වෙති. මේ නිසා බස්නාහිර පළාතේ පුරන් කුඹුරු ප්‍රමාණය සෙසු පළාත් හා සසඳන කළ ඉහළ අගයක් ගන්නා බව පැහැදිලිය.

බස්නාහිර පළාතේ පමණක් කුඹුරු ඉඩම් හෙක්ටයාර 12,000 ක් වගාවෙන් පුරන්වීම හේතුවෙන් එම ඉඩම්වල ඇකේෂියා, වල් ආතා, විවිධ පන්වර්ග මෙන්ම කිඹුලන් වැනි දරුණු සතුන් හා සර්පයින් ද නාගරිකව ඉහළ ගොස් තිබේ. එමෙන්ම මී ගහණය ඉහළ යාම නිසා ලෙප්ටොස්පයිරොසිස් වැනි මාරාන්තික රෝග තත්ත්වයන් ද ඉස්මතුව පවතී.

## සෝජාන් වගා ක්‍රමය

සෝජාන් වගාව යනු වගාව සඳහා යොදා නොගන්නා බිම්වල භූමි හායනය අවම කරමින් තෙත් බිම් ආශ්‍රිත පරිසර පද්ධති සුරක්ෂිත කරමින් කෘෂි පලදායීතාව ඉහළ නැංවීමට ඉන්දුනීසියානු සාම්ප්‍රදායික පහත් බිම් කෘෂි බෝග රටාවකි.

අඩි දහයක් දොළහක් පමණ උසට පස් ගොඩ කර ජලයෙන් වගාවට හානි නොවන ලෙස කානු සකස් කර සෝජාන් ක්‍රමය යටතේ වගාවන් සිදු කරනු ලැබේ. මෙම වගා ක්‍රමය බැලූ බැල්මට ආකර්ෂණීය වගා ක්‍රමයකි. සාගත තත්ත්වයට මුහුණ දීම සඳහා මෙවැනි සෝජාන් ව්‍යාපෘති ක්‍රමය උචිත වැඩ පිළිවෙළකි. වගා කළ නොහැකිව අත්හැර දමා ඇති බිම් සියල්ලම සෝජාන් ක්‍රමය යටතේ ආහාර භෝග වගාවට යොදා ගැනීමට පිළිවන.

එමෙන්ම මෙහි ඇති වැදගත් ම කාරණය නම්, වගාවන්ට අමතරව පස් වැටි අතර ජල පහර තුළ මත්ස්‍ය වගාව ද සාර්ථකව සිදු කළ හැකිය. අපේ රටේ මත්ස්‍ය පරිභෝජනය ගත් විට තවමත් අවශ්‍ය පෝෂණ මට්ටම ළඟා කර ගත හැකි ප්‍රමාණයට මසුන් පරිභෝජනය කරන්නේ සීමිත පිරිසකි. ඊට හේතුව නම් අපේ රටේ මත්ස්‍ය වගාව විධිමත් පරිදි තවමත් ජාතික අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා සිදු නොකිරීමයි. ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට අවම වශයෙන් ග්‍රෑම් 200ක් වුවද ඇතැම් ප්‍රදේශවල දිනකට මත්ස්‍ය ග්‍රෑම් 20 ක්වත් පාරිභෝජනය නොකරයි.

ලොව බොහෝ රටවල් ආහාර භෝග වගාවේ දී ආහාර භෝග වගා කරන අතරම මත්ස්‍ය වගාවට ද අවධානය යොමු කරති. විශේෂයෙන් වී වගාවේ දී එම ජලයෙන්ම මත්ස්‍ය වගාව ද සිදු කරති. එය ගොවි ජනතාවට අමතර ආදායමකි.
එමනිසා සෝජාන් ව්‍යාපෘතිය තුළ ද මත්ස්‍ය වගාව පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළ හැක.
දැනට වගා කර ඇති ඉඩම් මෙන්ම වගාවට නොගෙන පුරන්වීමට ඉඩ හැර ඇති සියලු ඉඩම් වගා කිරීම සඳහා සෝජාන් ක්‍රමය ඉතාමත් උචිත ක්‍රමයකි.

## සෝජාන් වගාවේ වාසි..........

සෝජාන් වගාවේ වගාකරනු ලබන සියලුම භෝගයන්හි අස්වැන්න එකට තුනක අනුපාතයක වර්ධනයක් ඇත. එනිසා ගොවියාට සුළු භූමි ප්‍රමාණයකින් විශාල අස්වැන්නක් ලබා ගැනීමේ වාසිය පවතී. වගාවක සාර්ථක අස්වැන්නන් ලබා ගැනීමට නම් හිරු එළිය සීයට සීයක් අවශ්‍ය වේ. සෝජාන් වගාව තුළ විශාල ගස් නොමැති නිසා කෙලින්ම හිරු එළිය වගාවට පතිත වේ. එනිසා විශාල අස්වැන්නක් ලබා ගත හැකිය.
කෘෂිකර්මාන්තයට අමතරව සත්ව පාලනය සාර්ථකව සිදු කළ හැකිය. ඒ අතරින් කුකුල් පාලනය හා මාළු වගාව සාර්ථකව සිදුකළ හැකිය. වගාව අතර පටි තට්ටු ක්‍රමයට කුකුළු කූඩු සකසා කුකුල් පාලනය සිදු කළ හැකිය. ජලය සහිත අගලට උඩින් කුකුළු කූඩු සාදන බැවින් කුකුළන්ගේ අපද්‍රව්‍ය ජලයට පතිත වී ජලයේ ඇල්ගී සෑදේ. ජලයේ සිදුකරන මත්ස්‍ය වගාවේ සිටින මාළුන් එම ඇල්ගී ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙන් ඔවුන්ගේ ශරීර ගත වීමෙන් මාළුන් වේගවත් වර්ධනයක් පෙන්නුම් කරයි. තිලාපියා මාළුවා මාස 3-4 අතර කාලය තුළ කිලෝවකට වඩා වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි. ඉන්දියාවේ බිත්තර අඩු මිලකට ලබා දෙනු ලබන්නේ මෙම පටි තට්ටු ක්‍රමය ඔස්සේ සකස් කරන හා බොක්ස් ක්‍රමයට සකස් කරන කුකුලළු කූඩු භාවිතා කිරීමෙනි. පටි තට්ටු ක්‍රමයට කුකුල් කූඩු සාදා ගැනීමෙන් කුඩා ඉඩක විශාල කුකුලන් ප්‍රමාණයක් ඇති කළ හැකිය.

සෝජාන් වගාව තුළ ඉල්මැස්සාගේ හානිය ඉතාමත් අවම වේ. එයට හේතු වන්නේ ඉල්මැස්සාගේ බීජ අවස්ථාව එළවළු හා පලතුරු ගෙඩිවල සිදුවන අතර කෝෂ අවස්ථාව වන විට ඒවා පොළොවට පතිත වී පොළොවේ වර්ධනය වේ. එහෙත් සෝජාන් වගාවේදී ගෙඩි හට ගන්නේ පොළොවට ඉහළින් නොව ජලයට

ඉහළින් නිසා ඉල් මැසි බීජ වතුරට පතිත වී විනාශ වේ. එනිසා ඉල් මැසි හානියට අමතර වියදමක් දැරීමට සිදු නොවන අතර කෘමීන්ගෙන් හානි නොවූ සාර්ථක එලදාවක් ලබා ගත හැක.
ඉල් මැසි මෙන්ම වෙනත් කෘමි හානි අවම නිසා රසායනික පළිබෝධනාශක භාවිතා කිරීමට සිදු නොවේ. එබැවින් කාබනික වගාවක් ලෙස ශරීරයට හිතකර අස්වැන්නක් ලබා ගැනීමට හැකි වේ. එමෙන්ම කාබනික ගොවිතැනක එලදාව නිසා වෙනත් එළවළු පළතුරුවලට වඩා ඉහළ මිළක් මෙන්ම විශාල ඉල්ලුමක්ද පවතී. මෙම වගාව අතර මී මැසි පාලනයද සිදු කළ හැකිය. මී පැණි පිටරටින් ගෙන ඒමට වාර්ෂිකව විශාල මුදලක් වැයවන අතර කාබනික ගොවිතැනක් නිසා එළවළු වගාවේ නිතරම හටගන්නා මල් සඳහා මී මැස්සන් ඇදී එන බැවින් මී මැසි පාලනය සාර්ථකව සිදුකර විශාල ආදායමක් අමතර වශයෙන් ලබාගත හැකිය. ජල අගල් වලින් වටවී ඇති නිසා රිලවුන්, වඳුරන්, ඉත්තෑවන්, වල්ඌරන් වැනි සතුන්ගෙන් වගාවට සිදුවන හානියද අවමය.

මැලේසියාව, තායිලන්තය, ඉන්දුනීසියාව ආදී රටවල ප්‍රධාන වගා ක්‍රමයක් වන සෝජාන් ක්‍රමයට වගා කළ ලංකාවේ පළමු වන වගාබිම හෝලුවාගොඩ වෙල්යාය බව විශ්වාස කෙරේ. ගාල්ල බද්දේගම ප්‍රධාන පාරට මායිම් පිහිටා ඇති බෝපේ පොද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙය වසර ගණනක් තිස්සේ පුරන්ව පැවති වෙල් යායකි. කරදිය ගැලීමත්, වතුර බැස නොයාමත් නිසා වී වගා කිරීමට නොහැකිව එය අතහැර දමා තිබිණ. කරදිය ගැලීම සහ වතුර බැස නොයාම නිසා වගා කිරීමට නොහැකි කුඹුරුවලට සුදුසුම වගා ක්‍රමය සෝජාන් ක්‍රමය බව කෘෂි විද්‍යාඥයින්ගේ මතයද වේ.

හෝලුවාගොඩ වෙල්යාය මේ වනවිට දිනකට රුපියල් ලක්ෂ ගණනින් ආදායම් ලබන සාර්ථක වගා බිමකි. මෙම ගොවිපල ඉදිරිපිට දිනපතා උදෑසන කාලයේ දිගු පෝලිමකි. ඒ වසවිස නැති නැවුම් එළවලු, පළතුරු සහ පලා වර්ග මිලදී ගැනීමටය.



අවුරුදු ගණනක් මේ අක්කර සිය ගණනක විශාල කුඹුරු යාය පුරන්ව තිබුනේ කරදිය ජලය ගැලීමත් බැස නොයාමත් නිසයි. එවැනි භූමි වලට සුදුසුම ක්‍රමය මේ ජලය මතුපිට වගා කළ හැකි සෝජාන් ක්‍රමයයි. මැලේසියාව, තායිලන්තය, ඉන්දුනීසියාව ආදි රටවල මේ සෝජාන් වගා ක්‍රමය ඉතා සාර්ථකව සිදු කරනු ලබයි. මෙම ගොවිපොලෙහි අස්වැන්න නෙළන්න යන්නේ බෝට්ටුවලින්ය.

ඒවාට කිසිම රසායනික පොහොර හෝ කෘමි නාශක යොදන්නේ නැත. වර්තමානය වන විට එළවළු වර්ග දහසයක් ද පැපොල් හා කෙසෙල්ද පලා වර්ගද වගා කර ඇත. පළමු අදියර යටතේ අක්කර පහක මේ වගාව ආරම්භ කර ඇති අතර මූලිකව රුපියල් ලක්ෂ දහයකට අධික මුදලකින් ආරම්භ කර අත. එම මුදල මේ වනවිට ලබා ගෙන ඇති අතර දවසකට රුපියල් ලක්ෂයක පමණ ආදායමක් ලබමින් සිටී.

මේ නිසා තරුණ පිරිසට රැකියා ලබා දීමට හැකි වි ඇති අතර පාරිභෝගික ජනතාවට වස විස නැති පිරිසිදු එළවලු පළතුරු ලබා දිමටත් හැකි වී ඇත. මෙම වෙල් යායේ තවත් කොටසක නෙරි සකස් කර වගාවට සූදානම් කර ඇත. මේ ප්‍රදේශයේ මොණරු ගිරව් විශාල වශයෙන් සිටියත් වගාවට කිසිම හානියක් සිදු කර නොමැත. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් මීටර් හතරක් පළලට මීටර් දෙසිය හතළිහක් දිගට නෙරි සකසා දී ඇති අතර තරුණ පිරිසක් වගාව ආරම්භ කර ඇත.





මෙහි එළවලු පළතුරු පමණක් නොවෙයි කුකුළන් ඇති කිරීමත් මී මැසි ජනපද ඇති කිරීමත් සිදුවේ. එයට අමතරව මේ නෙරි (පාත්ති) අතර තිබෙන ජලයට මිරිදිය මාලු පැටව් ලක්ෂ ගණනක් මුදාහැර ඇත. සාමාන්‍ය පොළවේ වගා කරනවාට වඩා මේ ක්‍රමයේ අස්වැන්න ඉතා විශාලය. අස්වැන්න වැඩි වීමට නම් හිරු රශ්මිය අවශ්‍යය. ජලයේ හිරු රශ්මිය මධ්‍යම රාත්‍රිය වනතුරු පවතින අතර උදේට නැවත හිරු එළිය ලැබේ.

උනන්දුව හා කැපවීමක් පවතීනම් මෙවන් පුරන් කුඹුරු සෝජාන් ක්‍රමයට වගා කිරීමට යොමු වීමෙන් අප රටද කෘෂි කර්මාන්තය මගින් ඉදිරියට යාමක් හා එය රටේ සංවර්ධනයට මහත් රුකුලක් වනු ඇත.

පී.ඒ. චිත්‍රා ජයසිංහ
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
බොරැල්ල

# "ලස්සන රටක් පොහොසත් ජීවිතයක්" යථාර්ථයක් කර ගැනීමට පුද්ගල චර්යාවේ ඇතිකර ගතයුතු වෙනස්කම්

## හැඳින්වීම

### හැඳින්වීම

ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත්වලින් පිරුණු අපූර්ව දූපතකි. මෙම ලස්සන දිවයින අද ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ අභියෝගයන්ට මුහුණ දී ඇත. වර්තමාන රජය "ලස්සන රටක් පොහොසත් ජීවිතයක් " තේමාව යථාර්ථයක් කර ගැනීම සඳහා දැඩි ප්‍රයත්නයක නියැලෙමින් සැබෑ සමෘද්ධිය හා සුන්දරත්වය කරා යාමේ ගමනක නිරතව සිටියි. මෙම ගමනෙහි සාර්ථකත්වය රඳා පවතින්නේ රටේ ජනතාවගේ ක්‍රියාකාරකම්, දෘෂ්ටිකෝණ සහ හැසිරීම් රටාවන්හි ගැඹුරු වෙනස්කම් මතය. ලස්සන රටක් හා පොහොසත් ජීවිතයක් පිළිබඳව සාකච්ඡා කිරීමේදී මෙය හුදු භෞතික සම්පත් වර්ධනයකට හෝ ව්‍යුහාත්මක වෙනස්කම් ප්‍රමාණයකට සීමා නොවී එය ජනතාවගේ සදාචාරාත්මක වටිනාකම්, සමාජ වගකීම සහ සහයෝගිතාවයෙන් ගොඩනගා ගන්නා ලද්දක් විය යුතුයි.

ඉතිහාසය විමර්ශනය කළ විට, සමෘද්ධිමත් සමාජ ගොඩනගා ගැනීමේ මූලික සාධකය තිබුණේ ජනතාවගේ සමූහික හැසිරීම හා පුද්ගලික අනන්‍යතාවය මතයි. රාජ්‍ය ප්‍රතිපත්ති, ආර්ථික ක්‍රමවේද හෝ තාක්ෂණික දියුණුව තනිවම රටක ඉතිහාසය නිර්ණය නොකරයි. එසේම සමාජ ප්‍රගතිය සහ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ජනතාවගේ චර්යාවේ හා මානසිකත්වයේ පරිණාමයක් අවශ්‍යයි. මෙම ලිපියෙන් ප්‍රතිපාදනය කෙරෙන්නේ ඒ සඳහා අවශ්‍ය වන ප්‍රධාන චර්යාමය වෙනස්කම් ගැන සවිස්තරාත්මක විශ්ලේෂණයකි.

### සමාජ වගකීම සහ පිළිගැනීමේ මානසිකත්වය

සමාජ වගකීම යනු පුද්ගලයෙකු තම ක්‍රියාකලාපයන්ගෙන් සමාජයට ඇතිවන බලපෑම් ගැන සවිඥානික වීමයි. ලස්සන රටක් ගොඩනගා ගැනීමේදී මෙය මූලික සංරචකයකි. අපගේ සමාජයේ බොහෝ දෙනා තම පුද්ගලික අවශ්‍යතා හා පවුලේ යහපැවැත්මට වැඩි අවධානයක් යොමු කරන අතර, සමස්ත සමාජයේ යහපැවැත්ම සම්බන්ධයෙන් උදාසීන වෙති. මෙම ප්‍රවණතාව වෙනස් කිරීම අත්‍යවශ්‍ය වේ.

සමාජ වගකීම සහිත පුරවැසියෙකු තම පරිසරය පිරිසිදුව තබා ගැනීම, පොදු සම්පත්වලට හානි නොකිරීම, නීති - රීති රෙගුලාසි පිළිපැදීම, සමාජ ගැටලු විසඳීමට ක්‍රියාශීලීව සහභාගී වීම වැනි ගුණාංග පෙන්වයි.

අන්‍යයන්ගේ වැරදි හුවා දක්වමින් චෝදනා කරමින් පමණක් සිටීමට වඩා, විචාරශීලීව ගැටලු විසඳීමට දායක වීමේ මානසිකත්වය වර්ධනය කරගත යුතුය.

පරිසරය ගැන ගැඹුරු අවබෝධයක් ඇති කරගැනීම ද සමාජ වගකීමේම කොටසකි. ප්ලාස්ටික් භාවිතය අවම කිරීම, ජල ප්‍රභවයන් සුරකිම, ගස් හා පැල වගා කිරීම, ප්‍රාදේශීය පරිසරය පිරිසිදුව තබා ගැනීම වැනි සරල වැඩකටයුතු හරහා ලස්සන රටක් ගොඩනගා ගැනීමේ ගමනට දායක විය හැකිය. සමාජ වගකීම යනු කිසියම් විශේෂ පරිපාලන ව්‍යුහයකට හෝ වෘත්තීය තනතුරකට සීමා වූ දෙයක් නොව, සියලුම පුරවැසියන් දෛනික ජීවිතයේ ප්‍රගුණ කළ යුතු ගුණාංගයකි.

**කාර්යක්ෂමතාව සහ කාලීනත්වයේ සංස්කෘතිය**

කාර්යක්ෂමතාව සහ කාලීනත්වය වර්තමාන ලෝකයේ සාර්ථකත්වයේ අත්‍යවශ්‍ය සාධක වේ. අපගේ සමාජයේ කාලීනත්වය සම්බන්ධයෙන් සාම්ප්‍රදායිකව ඇති ප්‍රවණතා ජාතික ප්‍රගතියට බාධාවක් වී ඇත. රාජ්‍ය කාර්යාලවල, අධ්‍යාපන ආයතනවල, සෞඛ්‍ය සේවාවල සහ පෞද්ගලික ආයතනවල කාර්‍යක්ෂමතාව වැඩිදියුණු කිරීම තුළින් මුළු ජාතියේම ඵලදායිත්වය වර්ධනය කළ හැකිය.

කාලීනත්වය යනු කලට වේලාවට පැමිණීම හෝ කාර්‍යයන් නියමිත කාලයට සම්පූර්ණ කිරීමට පමණක් සීමා වූවක් නොවේ. එය සම්පත් කළමනාකරණය, සැලසුම් කිරීම, ප්‍රමුඛතා නිර්ණය කිරීම සහ අනවශ්‍ය ප්‍රමාදයන් මගහැරීම වැනි පුළුල් සංකල්පයකි. එය රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිට ආරම්භ කර කාර්‍යක්ෂමතාවයේ සංස්කෘතිය ගොඩනගා ගැනීම අවශ්‍ය වේ.

සමකාලීන තාක්ෂණය භාවිත කර කාර්‍යක්ෂමතාව වර්ධනය කරගැනීම ද ඒ සම්බන්ධයෙන් වැදගත් අංගයකි. ඩිජිටල් සාක්ෂරතාව, ස්වයංක්‍රීය ක්‍රම, සම්පත් සැලසුම් කිරීමේ ක්‍රමවේද භාවිත කරමින් පුද්ගලික හා පොදු ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව නැංවිය හැකිය. එපමණක් නොව මෙමගින් කාර්‍ය සම්පාදනයේ ගුණාත්මකභාවය ද වර්ධනය වේ.

### අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධනයේ ආකල්පීය වෙනස්කම්

ජනතාවගේ අධ්‍යාපනික මට්ටම සහ කුසලතා මට්ටම රටේ සමෘද්ධියට සෘජුව බලපෑම් කරයි. කෙසේ වෙතත්, අධ්‍යාපනය සම්බන්ධයෙන් අපගේ සමාජයේ වර්තමාන සම්ප්‍රදායික ආකල්පය වෙනස් කළ යුතුය. පිටපත් කිරීම, කටපාඩම් කිරීම, පරීක්ෂණ, සමත් කිරීම වැනි ඉලක්කය පදනම් කරගත් අධ්‍යාපනයේ සිට

නිර්මාණශීලීත්වය, විචාරාත්මක චින්තනය සහ ගැටළු විසඳීමේ හැකියාව වර්ධනය කරන අධ්‍යාපනයකට සංක්‍රමණය විය යුතුය.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්කම් මතුපිටින් නොව ගැඹුරින් සිදු කළ යුතුය. දෙමව්පියන්ගේ අපේක්ෂාවන්, අධ්‍යාපනයේ අරමුණු, දක්ෂතා මට්ටම් සම්බන්ධයෙන් ගැඹුරු වෙනස්කම් ඇති කළ යුතුය. ප්‍රතිඵල මතකයට පදනම් වූ අධ්‍යාපනයේ සිට ක්‍රියාවලි පදනම් කරගත්, නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කරන අධ්‍යාපනයකට වෙනස් විය යුතුය.

තාක්ෂණික කුසලතා, භාෂා කුසලතා, සන්නිවේදන කුසලතා, නායකත්ව කුසලතා වැනි 21 වැනි සියවසේ ඉල්ලුම් සපුරාලීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය කර ගැනීම ද අත්‍යවශ්‍ය වේ. ජීවිතයේ සෑම අවස්ථාවකදීම ඉගෙනීමේ ආකල්පය වර්ධනය කර ගැනීම, පර්යේෂණ හැකියාව සංවර්ධනය කර ගැනීම, නව තාක්ෂණයන්ට අනුගත වීමේ නම්‍යශීලිභාවය වර්ධනය කර ගැනීම වැදගත් වේ.

### ආර්ථික සදාචාරය සහ නීත්‍යනුකූලත්වය

රටක සමෘද්ධිය සහ අඛණ්ඩතාව සඳහා ආර්ථික සදාචාරය සහ නීත්‍යානුකූලත්වය මූලික අවශ්‍යතාවයකි. දූෂණය, වංචාව, බදු මගහැරීම, කළු ප්‍රභවයන්, නීතිය උල්ලංඝනය කිරීම වැනි ක්‍රියාකලාපයන් මඟින් රටේ ආර්ථිකයට හා සමාජයට හානියක් සිදුවේ. මේවා මගහැරීම පමණක් නොව, ස්වකීය ආර්ථික ක්‍රියාකලාපයන්හිදී පරිපූර්ණ සදාචාරාත්මක ආකල්පයක් පිළිපැදීම අවශ්‍ය වේ. ප්‍රමුඛ ව්‍යාපාරිකයන්ගේ සිට සාමාන්‍ය ජනතාව දක්වා සෑවොම තම ආර්ථික කටයුතුවල අවංකභාවය සහතික කිරීම ඒ සඳහා අත්‍යවශ්‍ය වේ. සැපයුම්කරුවන්ට නියමිත කාලයෙහි ගෙවීම, ගුණාත්මක නිෂ්පාදන සහ සේවා සැපයීම, පරිභෝජකයන්ගේ අයිතිවාසිකම් ගරු කිරීම, පරිසර හිතකාමී ව්‍යාපාරික ක්‍රම, සමාජයට ප්‍රයෝජනවත් ව්‍යාපාරික ක්‍රියාකලාපයන් වැනි ඒවා ආර්ථික සදාචාරය තුළ අන්තර්ගත වේ.

බදු ගෙවීමේ වැදගත්කම, රාජ්‍ය නීති රීති පිළිපැදීම, ලියාපදිංචි ව්‍යාපාරික ක්‍රියාකලාපයන්හි නිරත වීම, නිල ගිණුම් කරණයන් හා වාර්තාකරණය, ව්‍යාපාරික ප්‍රතිපත්ති නිර්ණයවල සදාචාරාත්මක සලකා බැලීම වැනි අංග මගින් රටේ ආර්ථිකයට සහයෝගයක් ලබා දිය හැකිය. මෙය රටේ ආර්ථික ගණන්කිරීම්වල නිරවද්‍යතාවය වර්ධනය කරන අතර ගෝලීය අවස්ථා සඳහා ඉඩ හසර ලැබේ.

### සම්ප්‍රදායික වටිනාකම් සහ නූතන ගතිකත්වයේ සමතුලිතතාවය

ඕනෑම රටක ප්‍රගතිය, සම්ප්‍රදායික වටිනාකම් රකිමින් නූතන අවශ්‍යතාවන්ට නම්‍යශීලීව අනුගත වීමේ හැකියාව මත රඳා පවතී. අප විසින් අපගේ සංස්කෘතිය, ආගම්, පවුල් කේන්ද්‍රගත වටිනාකම්, ගෝලීය ආදර්ශමය ගුණාංග රැක ගනිමින් ඒ සමගම ගෝලීයකරණයේ අවශ්‍යතාවන්ට අනුගතවීමේ සුවිශේෂී හැකියාව වර්ධනය කරගත යුතුය.

සම්ප්‍රදායික වටිනාකම්වල ඇති ධනාත්මක සාරධර්ම - එනම් ගරුත්වය, සහයෝගිතාව, සදාචාරය, කල්‍යාණ මිත්‍රත්වය, ප්‍රජා හැඟීම, ගැඹුරු සම්බන්ධතා, ධර්මීය වටිනාකම් වැනි ඒවා නම්‍යශීලීව වර්ධනය කර ගැනීම වැදගත් වේ. එම සමගම පැරණි චින්තන ක්‍රම, කාලීන නොවන සම්ප්‍රදායන්, ප්‍රගතියට බාධාකාරී සම්ප්‍රදායන් මගහැර නවීන ගතිකත්වයට යොමුවීම අවශ්‍ය වේ. ලිංගික සමානාත්මතාවය, තරුණ මානව අයිතිවාසිකම්, තාක්ෂණික දියුණුව, ගෝලීය සන්නිවේදනය, අධ්‍යාපනික නවීකරණයන් වැනි නූතන අවශ්‍යතාවන්ට අනුව යමින් සංස්කෘතික අනන්‍යතාවය රකිමින් සාර්ථක සමතුලිතතාවයක් ඇති කළ යුතුය. මෙම සමතුලිතතාවය මගින් ගෝලීය තරගකාරිත්වයෙහි සාර්ථක වීමත් සමගම සංස්කෘතික උරුමයන් ආරක්ෂා කළ හැකිය.

### නායකත්ව ගුණාංග සහ සහයෝගිතාවය

සමාජයේ සෑම මට්ටමකම නායකත්ව ගුණාංග සංවර්ධනය කිරීම රටක ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. නායකත්වය යනු සම්ප්‍රදායිකව උපකල්පනය කර ඇති පරිදි කිසියම් පාලන තනතුරකට හෝ පරිපාලන ධුරයකට සීමා වූ දෙයක් නොව, සමාජයේ සෑම සාමාජිකයෙකුගේම දෛනික ජීවිතයේ පෙන්නුම් කළ යුතු ගුණාංගයකි. කුඩා ප්‍රජා සංගම්වල සිට විශාල ආයතන දක්වා ද, පවුල්වල සිට ජාතික මට්ටම දක්වා ද නායකත්ව ගුණාංග සංවර්ධනය කිරීම අවශ්‍ය වේ.

නායකත්වයේ මූලික සංරචක වන්නේ ගැටළු විසඳීමේ හැකියාව, පොදු අරක්ෂාව, ආවේණික බුද්ධිය, සහයෝගිතාව, පරමාදර්ශී බව, ජනතා හිතකාමී බව සහ සජීවීකාරක බවයි. රටේ සෑම කලාපයකම, සෑම වෘත්තීය ක්ෂේත්‍රයකම, සෑම සමාජ මට්ටමකම මේ ගුණාංග සම්පන්න පුද්ගලයන්ගේ ජාලයක් ගොඩනගා ගැනීම තුළින් ජාතික මට්ටමේ සමස්ත සාර්ථකත්වයක් ලබා ගත හැකිය.

සහයෝගිතාව සම්බන්ධයෙන් වැදගත්ම කරුණ නම්, තරගකාරීත්වයට අමතරව සමූහික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීමයි. පුද්ගලික අභිරුචි හා පරමාර්ථයන් සාක්ෂාත් කරගනිමින් සමගම පොදු යහපැවැත්මට දායක වීමේ ස්වකීය අර්ථ සාධකයක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ. මෙම

සහයෝගීතාව සම්ප්‍රදායික පවුල් ඒකක, ප්‍රජා සංගම්, අධ්‍යාපන ආයතන, ආගමික ආයතන, කර්මාන්ත ක්ෂේත්‍රය, සිවිල් සමාජය වැනි සෑම ක්ෂේත්‍රයකම වර්ධනය කළ යුතුය.

## පාරිභෝගික හැසිරීම් සහ ජීවන රටාව

පාරිභෝගික හැසිරීම් සහ ජීවන රටාව රටේ ආර්ථිකයට, සමාජයට සහ පරිසරයට සෘජු බලපෑම් කරයි. නූතන පාරිභෝගික සමාජ ක්‍රමයට අනුව අධික පරිභෝජනය, අනවශ්‍ය නිෂ්පාදනය, මුදල් කළමනාකරණයේ අඩුපාඩු, , ප්‍රදර්ශනාත්මක ඇල්ම වැනි ප්‍රවණතා මගහැර අර්ථපූර්ණ ජීවන රටාවක් අනුගමනය කිරීම අවශ්‍ය වේ.

නිවැරදි ජීවන රටාව යනු පරිසර සුහදත්වය, නිර්දෝෂී පරිභෝජනය, නිෂ්පාදන තිරසාරභාවය, ප්‍රාදේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය, අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් සීමිත භාවිතය, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය වැනි සාර්වීය පාරිභෝගික හැසිරීම් කලාපයකි. මෙමගින් පෞද්ගලික මට්ටමේ ආර්ථික ශක්තිය වර්ධනය වනවාත් සමගම ජාතික මට්ටමේ ආර්ථිකයට ධනාත්මක බලපෑමක් ඇති කරයි.

සරල ජීවන රටාව, ප්‍රාදේශීය ආහාර භෝග වගාව, ප්‍රකෘතිමය ජීවන රටාව, දේශීය කලා කටයුතු, සම්ප්‍රදායික ශිල්ප කලා ප්‍රවර්ධනය, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාව, ප්‍රජා ක්‍රියාකාරකම්වල සහභාගීත්වය, ස්ථානීය දැනුම ප්‍රජාකරණය වැනි ක්‍රියාකාරකම් මගින් තිරසාර ජීවන රටාවක් ගොඩනගා ගත හැකිය. මෙම ජීවන රටාව පුද්ගලික ජීවන තත්ත්වය වර්ධනය කරන අතරම රටේ සමස්ත ආර්ථික වර්ධනයට සහාය වේ.

## තාක්ෂණික අනුවර්තනය සහ නවෝත්පාදන මානසිකත්වය

21 වැනි සියවසේ ප්‍රගතිය සඳහා තාක්ෂණික අනුවර්තනය සහ නවෝත්පාදන මානසිකත්වය අත්‍යවශ්‍ය සාධකයන් වේ. අපගේ සමාජයේ තාක්ෂණය සම්බන්ධයෙන් ඇති සම්ප්‍රදායික අදහස්, එනම් තාක්ෂණය යනු බටහිරට සීමා වූ දෙයක් හෝ අහේතුක ලොව වෙනස්කර ගැනීමේ මාධ්‍යයක් වන අතර තම ජීවිතයට අදාළ නොවන දෙයක් ලෙස සිතීම මගහැර, තාක්ෂණයේ මහඟු ප්‍රයෝජන ලබා ගැනීමේ සහ නිර්මාණශීලීව භාවිත කිරීමේ හැකියාව වර්ධනය කළ යුතුය.

ඩිජිටල් සාක්ෂරතාව, කෘත්‍රිම බුද්ධිය, ස්වයංක්‍රීයකරණය, අන්තර්ජාල ප්‍රවේශය, ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය, සමාජ ජාල මාධ්‍ය, ක්ලවුඩ් පරිගණනය වැනි නූතන තාක්ෂණික මාධ්‍යයන් සාර්ථකව භාවිතා කිරීමේ

හැකියාව සැවොම සතුව තිබිය යුතුය. තාක්ෂණය භාවිතා කිරීම තුළින් කාර්යක්ෂමතාව, ආර්ථික අවස්ථා, අධ්‍යාපනික සම්පත්, ගෝලීය ඇසුර වැඩිදියුණු කළ හැකිය.

නවෝත්පාදන මානසිකත්වය යනු ගැටළු විසඳීමට නව ක්‍රමවේද සොයා ගැනීම, පවතින ක්‍රම වැඩිදියුණු කිරීම, නිර්මාණශීලී විකල්ප සලකා බැලීම, අභියෝගයන්ට ධනාත්මකව ප්‍රතිචාර දැක්වීම වැනි ගුණාංගයන්ය. අපගේ අධ්‍යාපන ක්‍රමයෙන් ආරම්භ කර ව්‍යාපාරික ක්ෂේත්‍රය දක්වා නවෝත්පාදන මානසිකත්වය ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ. පර්යේෂණ හා සංවර්ධනය, නිර්මාණශීලී නිමවුම්, ක්ෂුද්‍ර හා මධ්‍යම ව්‍යාපාර, සිල්ලර නිෂ්පාදන කර්මාන්ත වැනි ක්ෂේත්‍රවල නවෝත්පාදනය ප්‍රවර්ධනය කළ හැකිය.

## සන්නිවේදන කුසලතා සහ බහු භාෂා හැකියාව

ගෝලීයකරණයත් සමඟ සන්නිවේදන කුසලතා සහ බහු භාෂා හැකියාව රටේ ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය සාරධර්ම බවට පත්ව ඇත. සිංහල, දමිළ, ඉංග්‍රීසි භාෂාවල පරිපූර්ණ දක්ෂතාව ලබා ගැනීම, ජාත්‍යන්තර සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම, සංස්කෘතික අන්තර්ක්‍රියා හැකියාව, ලිඛිත හා කථන සන්නිවේදන දක්ෂතා වැනි ක්ෂේත්‍රවල ජනතාවගේ හැකියාව වර්ධනය කළ යුතුය.

සන්නිවේදන කුසලතාවේ වැදගත්ම අංගයන් වන්නේ සවන් දීමේ හැකියාව, සංවේදනශීලීත්වය, සම්මාන සහගත සන්නිවේදනය, තර්කානුකූල ප්‍රකාශනය, ගැටුම් පිරිමසා ගැනීම, කණ්ඩායම් වැඩ කටයුතු, ප්‍රසිද්ධ කථනය වැනි දෙයයි. මෙම කුසලතා අධ්‍යාපනයේ සිට වෘත්තීය ක්ෂේත්‍රය දක්වා, පවුල් සබඳතාවන්ගේ සිට ජාත්‍යන්තර ව්‍යාපාර දක්වා ප්‍රයෝජනවත් වේ.

භාෂා අධ්‍යයනය සම්බන්ධයෙන්ද නව ආකල්පයක් අවශ්‍ය වේ. භාෂාව කේවල පරීක්ෂණ සම්මත කිරීමේ මාධ්‍යයක් ලෙස නොසලකා, සන්නිවේදනය, ක්‍රියාකාරීත්වය, ගෝලීය අවස්ථා, සංස්කෘතික හුවමාරුව, දැනුම ලබා ගැනීම වැනි ප්‍රායෝගික අරමුණු සඳහා භාවිත කිරීමේ හැකියාව වර්ධනය කළ යුතුය.

## සෞඛ්‍ය සහ යහපැවැත්මේ සංස්කෘතිය

ජනතාවගේ සෞඛ්‍ය සහ මානසික යහපැවැත්ම රටේ ප්‍රගතිය සඳහා මූලික සම්පතකි. සම්ප්‍රදායිකව සෞඛ්‍යය සම්බන්ධයෙන් අපගේ සමාජයේ ඇති ආකල්ප, එනම් සෞඛ්‍යය යනු රෝගී තත්වයක් ඇති විට පමණක් සලකා බලන දෙයක්, වැදගත්කම් නොදෙන දෙයක් යන්න වෙනුවට ප්‍රතිරෝධී සෞඛ්‍ය ආකල්පයක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ.

නිරෝගී ජීවන රටාව, නිතිපතා ශාරීරික ව්‍යායාම, සමතුලිත ආහාර රටාව, පරිසර සුදුසුකම්, දුම්වැටි, මත්ද්‍රව්‍ය මගහැර යාම, මානසික සෞඛ්‍යය, ආතතිය කළමනාකරණය, ප්‍රමාණවත් විවේකය, සමාජ සම්බන්ධතා වර්ධනය වැනි සාරධර්ම මගින් සමස්ත ජනගහනයේ යහ පැවැත්ම වර්ධනය කළ හැකිය.

සෞඛ්‍ය අධ්‍යාපනය, ප්‍රජා සෞඛ්‍ය ක්‍රියාකාරකම්, මානසික සෞඛ්‍ය සහාය, සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම සහ නූතන වෛද්‍ය විද්‍යාවේ සම්මිශ්‍රණය වැනි ක්ෂේත්‍රවල පුරවැසියන්ගේ දැනුම වර්ධනය කිරීම ද වැදගත් වේ. මෙමගින් සෞඛ්‍ය සේවා පිරිවැය අවම කරමින් ජනතාවගේ ගුණාත්මක ජීවනය වර්ධනය කළ හැකිය.

### පරිසර සහ තිරසාරභාවයේ වගකීම

ලස්සන රටක් ගොඩනගා ගැනීමේදී පරිසර සුරකිම සහ තිරසාර සංවර්ධනය මූලික අවශ්‍යතාවකි. කෙසේ වෙතත්, අපගේ සමාජයේ පරිසරය සම්බන්ධයෙන් ඇති සම්ප්‍රදායික මානසිකත්වය එනම් පරිසරය යනු රජයේ වගකීමක්, අන් අයගේ කරුණක්, තමන්ගේ ක්‍රියාකලාපයන්ගෙන් පරිසරයට අහිතකර බලපෑමක් ඇති නොවන දෙයක් යනාදිය මගහැර පරිසර වගකීමක් ගැනීම අවශ්‍ය වේ.

පුද්ගලික මට්ටමේ පරිසර වගකීම් අතර ජල සම්පත් සුරකිම, විදුලි බලශක්ති ඉතිරිකිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය, ප්ලාස්ටික් භාවිතය අවම කිරීම, ගස් හා පැළ රෝපණය, ස්වභාවික සම්පත් සුරකිම, ප්‍රතිචක්‍රීකරණය, කාබන් විමෝචන අවම කිරීම, පරිසර හිතකාමී ගමන් ප්‍රවාහනය වැනි ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

ව්‍යාපාරික ක්ෂේත්‍රයේ පරිසර වගකීම, කර්මාන්ත ක්‍රියාකලාපයන්හි පරිසර සුරකිම, කෘෂිකර්මයේ තිරසාර ක්‍රම, සමස්ත ජනතාවගේ පරිසර ගරු කිරීම, ස්වභාවික විපර්යාස සූදානම, පරිසර නීති රීති පිළිපැදීම, ජෛව විවිධත්ව සුරකිම වැනි ක්ෂේත්‍රවල සමස්ත සමාජයේ වගකීම සහිත ක්‍රියාමාර්ගයක් අවශ්‍ය වේ. මෙම පරිසර වගකීම අනාගත පරම්පරාවන් සඳහා ලස්සන රටක් හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් උරුම කර දීමේ අත්‍යවශ්‍ය සම්පතකි.

## නිගමනය

ලස්සන රටක් සහ පොහොසත් ජීවිතයක් කරා යන ගමන යනු භෞතික සම්පත් හෝ ව්‍යුහාත්මක වෙනස්කම් මගින් පමණක් සාර්ථක කළ හැකි ගමනක් නොවේ. එය ජනතාවගේ චර්යාව, ගුණාංග, දෘෂ්ටිකෝණ සහ ක්‍රියාකාරකම්වල ගැඹුරු වෙනස්කම් මත ගොඩනගා ගන්නා ලද සංස්කෘතික හා සමාජ විප්ලවයකි. මෙම ලිපියෙන් විස්තර කළ සමාජ වගකීම, කාර්යක්ෂමතාව, අධ්‍යාපනීය ආකල්ප, ආර්ථික සදාචාරය, සම්ප්‍රදායික වටිනාකම්, නායකත්ව ගුණාංග, පාරිභෝගික හැසිරීම්, තාක්ෂණික අනුවර්තන, සන්නිවේදන කුසලතා, සෞඛ්‍ය සහ පරිසර වගකීම යනාදිය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධිතව සාධනීය වෙනස්කම් ගොඩනගයි.

මෙම වෙනස්කම් ඉක්මනින් සිදුකළ හැකි හෝ බාහිර බලකායන් විසින් පනවා ගත හැකි වෙනස්කම් නොවේ. ඒවා සෑම පුද්ගලයෙකුගේම හෘදයාභ්‍යන්තරයෙන් ආරම්භ වී පවුල, ප්‍රජාව, ආයතන, සමාජය, ජාතිය යන සෑම මට්ටමකම ක්‍රියාත්මක විය යුතු වෙනස්කම්ය. සමස්ත රටේ සාර්ථකත්වය සඳහා සෑම පුරවැසියෙකුගේම ක්‍රියාශීලී සහභාගීත්වය සහ නිරන්තර කැපවීම අවශ්‍ය වේ.

අනාගතයේ දියුණු ශ්‍රී ලංකාව යනු පුද්ගලික සමෘද්ධිය සහ සමාජ සමතුලිතව ගොඩනගා ගන්නා, සංස්කෘතික අනන්‍යතාවය සුරකිමින් ගෝලීය තරගකාරීත්වයෙහි සාර්ථක වන, පරිසර සන්සුන්කම සහ ආර්ථික ශක්තිය ඒකාබද්ධව වර්ධනය කරගන්නා, නීතිය හා සදාචාරය ජනජීවිතයේ මූලික අරගලයන් බවට පත්කරගන්නා, අධ්‍යාපනය සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කරගන්නා රටකි.

මෙම අභිලාෂයන් සිදුකිරීම සඳහා අප සැවොම අද දිනයේ සිටම අපගේ සිතුවිලි, වචන සහ ක්‍රියාකාරකම්වල ගුණාත්මක වෙනස්කම් ඇති කරගනිමින්, අනාගත පරම්පරාවන් සඳහා යහපත් උරුමයක් ගොඩනගා ගැනීමේ වගකීම භාරගත යුතුය. ලස්සන රටක් පොහොසත් ජීවිතයක් යනු අප සැමගේම සාමූහික කැපවීම, උත්සාහය සහ සුබ ගුණාංගවලින් යුතු සුබ ප්‍රතිඵලයකි.

චම්පා අල්විස්

ජ්‍යෙෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරී

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

බොරැල්ල

# සහභාගිත්ව කළමනාකරණය මඟින් පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගොඩනගමු

වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව පොහොසත් රටක් ලස්සන ජීවිතයක් සඳහා ප්‍රවේශය පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක් ,ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක් ,නවීන ජීවිතයක්- පොසත් රටක් අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක් යන සිව් වැදෑරුම් ප්‍රවේශ ඔස්සේ සාකච්ඡාකර ඇත.මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය දැනටත් ක්‍රියාත්මකරමින් පවතින බැවින් මේ පිළිබඳව දීර්ඝව කරුණු සාකච්ඡා කිරීමක් මෙම අවස්ථාවේ සිදු කිරීම කාලෝචිත නොවේ.

මෙහිදී පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගොඩනැගීම සඳහා සහභාගිත්ව කළමනාකරණය ගලපා ගන්නා ආකාරය විග්‍රහකර ගැනීම වැදගත්වේ.

**අන්තර්ගත කරුණු**




- සහභාගීත්ව කළමනාකරණය යනු කුමක්ද
- සහභාගිත්ව කළමනාකරු කවුද?
- සහභාගිත්ව කළමනාකරු වැදගත් වන්නේ ඇයි?
- සහභාගීත්ව කළමනාකරුවන් වර්ග මොනවාද?
- ආශ්වාදජනක සහභාගිත්ව කළමනාකරුවෙකු වන්න කුමක් කළ යුතුද?

## සහභාගීත්ව කළමනාකරණය යනු කුමක්ද?

සහභාගීත්ව කළමනාකරණය යනු සේවකයින් තීරණ ගැනීමේදී සහ ව්‍යාපෘති කළමනාකරණය කිරීමේදී සම්බන්ධ කර ගන්නා කළමනාකරණ විලාසයකි. එමඟින් ඔවුන්ගේ කැපවීම වැඩි දියුණු කිරීම, සහයෝගීතාවය සහ කණ්ඩායම් අතර හැඟීම් ශක්තිමත් කිරීම සිදු වේ. සාම්ප්‍රදායික කළමනාකරණයට වෙනස්ව, එය වඩාත් මඟ පෙන්වන සහ මුලපිරීම සඳහා කුඩා ඉඩක් ඉතිරි කරයි, මෙම සහයෝගී විලාසය සංවිධාන තුළ සේව්‍ය සේවක සබඳතා ඉහළ යාමට හේතුවේ, මෙම සහයෝගී විලාසය වර්තමානයේ ආයතන තුළ ඉතා ජනප්‍රිය වෙමින් පවතින අතර ආයතනයේ සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු කිරීමට උපකාරී වේ.

## සහභාගීත්ව කළමනාකරණය අනෙකුත් නායකත්ව ශෛලීන් අභිබවා යනවාද? ඔබ සාර්ථක සහභාගීත්ව කළමනාකරුවෙකු වීමට ඵලදායී ක්‍රම සොයනවාද?

සාම්ප්‍රදායික නායකත්ව ශෛලීන් කණ්ඩායමේ නියැලීමට සහ බලගැන්වීමට අනදාල විය හැකි විට, සහභාගීත්ව කළමනාකරණ විලාසය වැඩි කිරීම නායකයින් ඔවුන්ගේ කණ්ඩායම් සමඟ අන්තර් ක්‍රියා කරන ආකාරය පරිවර්තනය කරන විශිෂ්ට තැග්ගක් විය හැකිය.

මෙම ලිපියෙන්, සහභාගිත්ව කළමනාකරුවන්ගේ ආශ්වාදජනක ගමන ගවේෂණය කරන්නෙමු, ඔවුන් සුවිශේෂී වන ගුණාංග සහ ඔවුන් ඔවුන්ගේ කණ්ඩායම් සහ සංවිධාන කෙරෙහි ඇති කරන බලපෑම අනාවරණය කර ගනිමු.

### සහභාගිත්ව කළමනාකරු කවුද?




ප්‍රජාතන්ත්‍රවාදී සහ අත්තනෝමතික කළමනාකරණ විලාසයන් අතර තරමක් වැටෙන්නේ සහභාගීත්ව කළමනාකරුවෙකි. ඔවුන් සමස්ත තීරණ ගැනීමේ ක්‍රියාවලිය පාලනය කරන්නේ නැත, නැතහොත් සෑම තීරණයක් සඳහාම සෑම සේවකයෙකුගෙන්ම සම්මුතියක් අපේක්ෂා නොකරයි.

ඔවුන් සේවක ආදානයේ සහ ප්‍රවීණත්වයේ වටිනාකම හඳුනා ගන්නා අතරම අවශ්‍ය විටදී මඟ පෙන්වීම් සැපයීමට සහ අවසාන තීරණ ගැනීමට නායකයන් ලෙස තමන්ගේ වගකීම ද පිළිගනී.

හොඳම සහභාගීත්ව කළමනාකරණ උදාහරණය නම්, විභේදන ඉල්ලා සිටීමට තමන් ගණන් ගත යුතු සේවකයින් සහ ඔවුන්ගේ කුසලතා කට්ටල ව්‍යාපෘතියේ අවශ්‍යතා සපුරාලන්නේද නැද්ද යන්න දන්නා සහභාගීත්ව කළමනාකරුවන් ය.

## සහභාගිත්ව කළමනාකරු වැදගත් වන්නේ ඇයි?

සහභාගීත්ව කළමනාකරණ විලාසයක් නවෝත්පාදන ධාවනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස මතු වී ඇත, සේවක නියැලීම පෝෂණය කිරීම සහ ආයතනවල පූර්ණ හැකියාවන් විවෘත කිරීම. සහභාගීත්ව කළමනාකරුවන් ආයතන වෙත ගෙන එන ප්‍රතිලාභ කිහිපයක් මෙන්න:

### 1. සහයෝගීතාව වැළඳ ගැනීම

සහභාගීත්ව කළමනාකරණය සහයෝගීතාවයේ පදනම මත නැගී සිටින අතර, තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී නායකයින් සේවකයින් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගනී. සහයෝගීතාවය වැලඳගැනීමෙන්, සහභාගිත්ව කළමනාකරුවන් ඔවුන්ගේ කණ්ඩායම්වල විවිධ ඉදිරිදර්ශන, කුසලතා සහ අත්දැකීම් විවර කරති.

### 2. විශ්වාස සංස්කෘතියක් නිර්මාණය කිරීම

සහභාගිත්ව කළමනාකරණයේ හදවතෙහි ඇත්තේ කණ්ඩායම් එකට බැඳ තබන මැලියම් වැනි විශ්වාස සංස්කෘතියකි. මෙම විලාසය මූර්තිමත් කරන සහභාගිත්ව නායකයින් විවෘත සහ විනිවිද පෙනෙන සන්නිවේදනයට ප්‍රමුඛත්වය දෙමින් සේවකයින්ට ඔවුන්ගේ අදහස් සහ උත්සුකයන් ප්‍රකාශ කිරීමට ආරක්ෂිත යැයි හැඟෙන පරිසරයක් නිර්මාණය කරයි.

### 3. ස්වාධීනත්වය හරහා බලගැන්වීම

සහභාගීත්ව කළමණාකරු සේවකයින්ට ඔවුන්ගේ ප්‍රවීණතා ක්ෂේත්‍රයන් තුළ ස්වයං පාලනයක් සහ තීරණ ගැනීමේ අධිකාරියක් ලබා දීමෙන් බල ගන්වයි. ඔවුන් තම කාර්යයේ හිමිකාරිත්වය ලබා ගැනීමටත්, ඔවුන්ගේ නිර්මාණශීලිත්වය මුදා හැරීමටත්, ඉහළ ඵලදායිතාවයක් සහ රැකියා තෘප්තියක් ලබා ගැනීමටත්, සංවිධානයේ සාර්ථකත්වයට අර්ථවත් ලෙස දායක වීමටත් හැකියාව ලබා දෙයි.

### 4. සාමූහික බුද්ධිය භාවිතා කිරීම

සහභාගීත්ව කළමනාකරණ ආකෘතියේ දී, කණ්ඩායමේ සාමූහික බුද්ධිය මත පදනම්ව සාමූහිකව තීරණ ගනු ලැබේ. සේවකයින්ගේ විවිධ ඉදිරිදර්ශන සහ තීක්ෂ්ණ බුද්ධිය උපයෝගී කරගනිමින්, සහභාගිත්ව කළමනාකරුවන්ට නව්‍ය, ඵලදායි සහ තිරසාර ප්‍රතිඵල ගෙන දෙන පුළුල් පරාසයක සාධක සලකා බලා හොඳින් දැනුවත් තීරණ ගත හැකිය.

### 5. වර්ධනය හා සංවර්ධනය පෝෂණය කිරීම

සහභාගිත්ව කළමනාකරු එදිනෙදා තීරණ ගැනීම ඉක්මවා යයි; එය පුද්ගල වර්ධනය හා සංවර්ධනය උත්ප්‍රේරණය කරයි. ඔවුන් තම සේවකයින්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට මෙම ශෛලිය නියාමනය කරයි, උපදේශකත්වය, පුහුණුව සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවස්ථා ලබා දෙයි.

### 6. ආයතනික කඩිසර බව වැඩි දියුණු කිරීම

වර්තමානයේ ශීඝ්‍රයෙන් වෙනස් වන ව්‍යාපාරික පරිසරය තුළ කඩිසර බව ප්‍රමුඛ වේ. සහභාගීත්ව කළමණාකරු තීරණ ගැනීම විමධ්‍යගත කිරීමෙන් සහ තොරතුරුවලට සමීපතම අයට තීරණ අධිකාරිය බෙදා හැරීමෙන් ආයතනික කඩිසර බව ප්‍රවර්ධනය කරයි. මෙමගින් ආයතනවලට ආයතනික පරිසරයේ වෙනස්කම් වලට ඉක්මනින් ප්‍රතිචාර දැක්වීමට, නැගී එන ප්‍රවණතා වලට අනුගත වීමට සහ නියමිත වේලාවට අවස්ථා ලබා ගැනීමට ඉඩ සලසයි.

## සහභාගීත්ව කළමනාකරුවන් වර්ග මොනවාද?

- **උපදේශන විලාසය,** වඩාත් බහුලව භාවිතා වන ප්‍රවේශය, තීරණ ගැනීමට පෙර සේවකයින් සමඟ උපදේශන සෙවීමේ ක්‍රියාවලියට යොමු වේ.

- **ජෝයි ඒකමතික තීරණ ගැනීමේ විලාසය** නොවේ සහභාගීත්ව කළමණාකරුවන් සේවක ප්‍රතිපෝෂණ ලබා ගන්නා විට සහ සේවකයින් නිදහසේ අදහස් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන විට සහ ඔවුන්ගේ කණ්ඩායම විසින් කරන තේරීම් සඳහා වගකීම දැරීම සිදුකරයි.
- සේවකයා සතු සමූහික විලාසය සහභාගීත්ව කළමනාකරණ ශෛලියේ අඩු ජනප්‍රිය තේරීමක් වන නමුත් සමස්ත ආයතනික ක්‍රියාකාරිත්වයට ප්‍රබල බලපෑමක් ඇත. එය එක් එක් සේවකයා තමන් සේවය කරන ආයතනයේ සෘජු කොටස් හිමිකම ගැන අවබෝධකර ගනියි.

## ආශ්වාදජනක සහභාගිත්ව කළමනාකරුවෙකු වන්න: කුමක් කළ යුතුද?


ස්වභාවිකව සහභාගීත්ව කළමනාකරණ ශෛලියක් තුළ, නායකයින් අන්‍යෝන්‍ය ගෞරවයේ වාතාවරණයක් පෝෂණය කරන අතර තීරණ ගැනීමේ, ගැටළු විසඳීමේ සහ ඉලක්ක සැකසීමේ ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීව නිරත වීමට සේවකයින් දිරිමත් කරයි.

සහභාගීත්ව කළමනාකරුවෙකු ලෙස ඔබේ කණ්ඩායම කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම ආරම්භ කිරීමට ඔබ අරගල කරන්නේ නම්, ඔබට කළ හැකි දේවල් කිහිපයක් මෙන්න.

### සහභාගීත්ව කළමනාකරණ විලාසය ආරම්භ කිරීමට උපාය මාර්ග

- සේවකයින් සමඟ තොරතුරු බෙදා ගන්න
- බහුවිධ දෘෂ්ටි කෝණයන් සලකා බලන්න
- නායකත්ව ගුණාංග ඇති පුද්ගලයින් බඳවා ගන්න
- මුල් චින්තනය උත්තේජනය කරන්න
- අදහස් හුවමාරු කර ගැනීමට සහ සංවිධානය කිරීමට කාලය සකසන්න

- පුහුණුව ලබා දෙන්න






## සේවකයින් සමඟ තොරතුරු බෙදා ගන්න

හොඳ කළමනාකරණ ක්‍රියාවලියක් ආරම්භ කළ යුත්තේ සංවිධානයේ ඉලක්ක, උපාය මාර්ග සහ අභියෝග පිළිබඳව අදාළ තොරතුරු සේවකයන්ට ලබා දෙන නායකයින් සමඟිනි. මෙම විනිවිදභාවය සේවකයින්ට විශාල චිත්‍රය තේරුම් ගැනීමට සහ දැනුවත් දායකත්වයක් ලබා දීමට උපකාරී වේ. එසේ නොමැතිව වීදුරු මැදිරියක සිට සේවක තරාතිරම නොබලා සියළු සේවකයින් තමාගේ වහළුන් ලෙස සලකා නියෝග නිකුත් කිරීම,තමා වෙත පැවරී ඇති බලය අනිසි ලෙස භාවිතය සේවක අතෘප්තිය වර්ධනය වීමට හේතු වේ. එමගින් ආයතන තුළ සේවා සේවක ගැටුම් උග්‍රවී දෛනික රාජකාරි බිඳවැටෙන තත්ත්වයක් උදාවීම වැලැක්විය නොහැකිය.අවසාන ප්‍රතිඵලය වන්නේ විනයක් ඇති සේවකයින් ආයතන කළමනාකරුවන් පිළිබඳ කළකිරීමට පත්වීමත් එයට ප්‍රතිචාර ලෙස ආයතනයෙන් වෙනත් ආයතන කරා මාරුවීමට හෝ එසේකළ නොහැකි සේවකයින් සේවයෙන් ඉවත්වීමට හෝ නියමිත කලට පෙර විශ්‍රාම යාමට ප්‍රයත්න දරයි. මෙම විනාශකාරී තත්ත්වය හේතුකොටගෙන ආයතනය විසින් මෙතෙක් ගොඩනගාගත් කීර්තිනාමය බිඳවැටී ආයතනය ඇවරවන තත්ත්වයක් උදාවීම ඉතා සෝචනීය අවස්ථාවකි. එමනිසා පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කරා යන ගමනේ දී සහභාගීත්ව කළමනාකරණය තුළ පිහිටා ආයතන තුළ විනිවිදභාවය රැකීම අත්‍යාවශ්‍ය කරුණකි.

## බහුවිධ දෘෂ්ටි කෝණයන් සලකා බලන්න

සහභාගීත්ව කළමනාකරණ ශෛලියේ තීරණාත්මක කොටසක් ලෙස, කළමනාකරුවෙකුට සෑම සේවකයෙකුගේම විවිධ දෘෂ්ටිකෝණයන් ඔබේ දෙපාර්තමේන්තුවෙන් පමණක් නොව, හරස්

දෙපාර්තමේන්තු සලකා බැලිය හැකිය. විසඳුම්වලට සම්බන්ධ අතර ඒවා ක්‍රියාත්මක ඔබ විශ්වාස කරන දේ




අදහස් ද ඉතා වටිනා බව එය ප්‍රතිපත්ති, තීරණ සහ ඕනෑම දෙයක් විය හැකි කිරීමට හොඳම ක්‍රම ලෙස විය හැකිය.

**නායකත්ව ගුණාංග ඇති පුද්ගලයින් බඳවා ගන්න**

මානව සම්පත් කළමනාකරණයේ දී සහභාගීත්ව කළමනාකරණයේ වැදගත්ම කොටස වන්නේ ආයතනයේ වැදගත් අංශ සඳහා සේවා පළපුරුද්ද සහ නායකත්ව ගුණාංග ඇති දක්ෂයින් බඳවා ගන්නා ආකාරයයි. ඵලදායී පරිසරයක් වැඩි කිරීම සඳහා, කුලියට ගත් කළමණාකරුවන් ගේ කළමනාකාරිත්වයේ මඟ පෙන්වීම් බලා නොසිට තම වගකීම් ඉටු කළ හැකි සේවකයින් බඳවා ගත යුතුය.

**මුල් චින්තනය උත්තේජනය කරන්න**

සේවක සහභාගිත්වය තුළින් කාර්ය සාධන කළමනාකරණය ගොඩනැගීම වැදගත් වේ. ස්වාධීනව සිතීමට සහ ඔවුන්ගේ අද්විතීය අදහස් ප්‍රකාශ කිරීමට පුද්ගලයන් බලගැන්වීමේ කාර්යයක් වන්නේ බුද්ධිමය කුතුහලය, අභිප්‍රේරණය සහ ගෞරවය යන සංස්කෘතියක් වර්ධනය කිරීමයි. එය විවිධ පසුබිම්වල සිටින එක් එක් පුද්ගලයා සංවිධානයේ සාමූහික සාර්ථකත්වයට දායක විය හැකි සුවිශේෂී අත්දැකීම්, තීක්ෂ්ණ බුද්ධිය සහ කුසලතාවන් සිදු කළ හැකිය යන සංකල්පය වැලඳ ගැනීමයි.

**අදහස් හුවමාරු කර ගැනීමට සහ සංවිධානය කිරීමට කාලය සකසන්න**

ඊට අමතරව, සේවකයින් අදහස් හුවමාරු කර ගැනීම, සැලසුම් සකස් කිරීම සහ එකිනෙකාගෙන් ඉගෙන ගන්නා නිතිපතා රැස්වීම් සහ මොළය අවුස්සන සැසි නොමැති නම් කණ්ඩායමක් හෝ සමාගමක් සාර්ථක විය නොහැක. ඔවුන්ගේ බලපෑම උපරිම කිරීම සඳහා, සියලු කණ්ඩායම් සාමාජිකයින්ට ඔවුන්ගේ අදහස් බෙදා ගැනීමට පහසු වන පරිදි ඇතුළත් සහ සහායක පරිසරයක් සහ කාලසටහනක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ.

**පුහුණුව ලබා දෙන්න**

ආයතනයට ප්‍රතිලාභ ලැබිය හැකි තීරණ හෝ විනිශ්චයන් කිරීමට සේවකයින්ට ඇති හැකියාව පහසු කිරීම සඳහා විශේෂඥයින් සහ දක්ෂ ජ්‍යෙෂ්ඨයින් සමඟ පුහුණුව අවශ්‍ය වේ. විවිධ ආකාරයේ පුහුණුව සමස්ත ආයතන කාර්ය සාධනය සහ පුද්ගලයන් කෙරෙහි විවිධ බලපෑම් ඇති කරන අතර ඵලදායී හා අර්ථවත් පුහුණුවක් පවත්වන්නේ කෙසේද යන්න නායකයින්ට සහ මානව සම්පත් කළමනාකරුවන්ට නොසලකා හැරිය නොහැක.

කිසිවෙක් සර්ව සම්පූර්ණ නැත, නායකත්ව විලාසය ද නැත. ඔබට සොයා ගත හැක්කේ සමහර අවස්ථාවන්හිදී වාසි සහ අවාසි යන දෙකම ඉටු කරන නායකත්ව විලාසය පමණි. එලෙසම, කණ්ඩායම් සාමාජිකයින් සක්‍රියව සහභාගී වී තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා දායක වන්නේ නම්, සහභාගිත්ව කළමනාකරුවෙකු හොඳ තේරීමක් විය හැකිය. මේ අතර, ක්ෂණික තීරණ අවශ්‍ය වන ඉතා සංකීර්ණ හෝ කාලය පිළිබඳ සංවේදී අවස්ථාවන් සමඟ කටයුතු කිරීමට ඔවුන් හොඳ නැත.

මතක තබා ගන්න, නම්‍යශීලී බව සහ නිශ්චිත සන්දර්භයන් තුළ අවශ්‍ය පරිදි නායකත්ව ශෛලීන් සකස් කිරීමේ හැකියාව ඵලදායී නායකයින්ගේ ප්‍රධාන ගුණාංග වේ.නායකයින් කණ්ඩායම් සාමාජිකයින් පුහුණුවීම් සහ රැස්වීම් වලදී සම්බන්ධ කර ගැනීමට අපූරු ක්‍රම සොයා ගන්නේ නම්, මෙන්ම සෑම ප්‍රතිපෝෂණ සැසියක් සහ මොළය අවුස්සන ක්‍රියාවලියක්ම බලගතු සහ ඵලදායී ප්‍රතිඵල බවට පත් කරයි.

මේ අනුව නිගමනය වන්නේ වර්තමාන ශ්‍රී ලංකාවේ සෑම ආයතනයක් තුළම හැකි සෑම අවස්ථවෙකදීම සහභාගීත්ව කළමනාකරණ ශෛලය අනුගමනය කිරීම මගින් වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන **“පොහොසත් රටක් ලස්සන ජීවිතයක්”**යන තේමාව යථාර්ථයක් බවට පත්කර ගැනීම පහසු වන බවයි.

*අන්තර්ජාලය ඇසුරින්..................*

කේ.එම්.ජී.සමරසේන

පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය


පිළිමතලාව

# මුහුණු පොතෙන් කතාවක්

මෙම කෙටි ලිපිය ලිවීමට පාදක වූයේ දිනක් මුහුණු පොතේ දී නෙත ගැටුණු එක්තරා සටහනකි. සමාජ මාධ්‍ය ඔස්සේ දිග හැරෙන නානාවිධ කතිකාවත් ඇසුරින් *"හංසයා දියෙන් කිරි වෙන් කර ගන්නාක් මෙන්"* හරවත් දෑ ජීවිතයට එක්කාසු කරගනිමින්, නිස්සාරයන් අපහරණය කරන්නට තරම් අපි බුද්ධිමතුන් විය යුත්තෙමු. "පැන්සලක තියෙනවා ගුණාංග 6ක්. ඔබත් ඒ ගුණාංග 6 පුරුදු කළහොත් අනාගතයේ දී හොඳ මිනිසෙකු වේවි......" යනුවෙන් ලියවුණ එම සටහන පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් යන්න සැබෑවක් කර ගැනීමට පුද්ගලිකව ගලපාගත හැකි නම් අගනේය.

***"පැන්සලක තියෙනවා ගුණාංග 6ක්. ඔබත් ඒ ගුණාංග 6 පුරුදු කළහොත් අනාගතයේ දී හොඳ මිනිසෙකු වේවි......"***

රටක සංවර්ධනය යන්න යථාවක් බවට පත්කර ගැනීමේ දී එය සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික යන සෑම සමාජ ස්ථාරනයකම සිදුවිය යුතු සාධනීය වර්ධනයක් අපේක්ෂා කළ යුතුය. එහි දී සමාජය බල ගැන්වීමෙහි ලා සමාජ සාධාරණත්වය සහතික කිරීම තුළින් කිසිවෙකු අත්නොහැර සහභාගීත්වයෙන් සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමේ දී පැන්සලේ කථාවෙන් ඔබටත්, මටත් හිතන්නට යමක් ඉතිරි කරාවි. පුද්ගලයෙකුට තමා තුළ ස්වයං විනයක්, හික්මීමක්, අභිමානයක් ගොඩනගා ගත හැකි නම් එවන් එකතුවකට යහපත් සමාජයක් ගොඩනගා ගත හැකිය.




***පළමු වැනි ගුණාංගය.......***

පැන්සලකට බෑ තනිවම ලියන්න. පැන්සලකින් ලියන්න නම් ඒක අල්ලගන්න කාගේහරි අතක් ඕන. අන්න ඒ වගේ වැඩවල දී සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබ ඉගෙන ගන්න. එවිට තමයි ඔබ කරන දේ සාර්ථක වන්නේ.

***දෙවන ගුණාංගය........***

ලියනකොට ලියනකොට පැන්සලේ තුඩ මොට වෙනවා. එහෙම වුණාම ලියන එක නතර කරලා ඒක ආයෙත් උල්කර ගන්න ඕන. උල් කරනකොට ටිකක් රිදේවි. ඒත් ඊට පස්සේ ඒක වඩාත් හොඳින් ලියාවී. ඒ වගේ ඔබටත් ඉද හිට සුළු සුළු දුක් වේදනා ඉවසාගන්න සිදුවේවි. හැබැයි ඊට පස්සේ ඔබ වඩාත් හොඳ කෙනෙක් වේවි.

***තුන්වන ගුණාංගය........***

පැන්සලෙන් ලියනකොට මොකක් හරි වැරැද්දක් වෙන්න පුළුවන්. එහෙම වුණොත් මකා ගන්න පුළුවන්. අන්න ඒ වගේ ඔබ අතින් වැරැද්දක් වුණොත් ඒක හදාගන්න ඕන. වැරැද්දක් හදා ගැනීම නරක දෙයක් නොවේ. එය අපට හරි පාරේ යන්නට උදව් වේවි.

**ඔයාගේ වටිනාම කොටස..... ඔයාගේ පෙනුමවත්, හමේ පාටවත් නෙමේ. ඒ ඔයා තුළ තියෙන හොඳ ගති ගුණයි.**

***හතරවන ගුණාංගය........***

පැන්සලක වටිනාම කොටස මොකක්ද?............ එළියේ පේන්න තියෙන හැඩරුව ද?.......... පාටද?........... නෑ........ ඒ එකක්වත් නෙවේ. පැන්සලක වටිනාම දේ තමයි ඒක ඇතුළෙ තියෙන මිණිරන් කූර. අන්න ඒ වගේ ඔයාගේ වටිනාම කොටස..... ඔයාගේ පෙනුමවත්, හමේ පාටවත් නෙමේ. ඒ ඔයා තුළ තියෙන හොඳ ගති ගුණයි.

***පස්වන ගුණාංගය........***

පැන්සලකින් යමක් ලීවාම ඒ ලියූ දේ ඉතිරි වෙනවා. ඒ නිසා ඔයා කරන හැම දෙයක්ම කල්පනාවෙන් කරන්න.

***හයවන ගුණාංගය........***

හයවන ගුණාංගය තමයි පැන්සලේ හැඩය. පැන්සල හරි කෙලින්. ඉදිකටුවක් වගේ. ඔබත් පැන්සලක් වගේ හරි කෙලින් ඉන්න. කෙලින් කටයුතු කරන්න. වංක නොවී අවංක වන්න.

***මුහුණු පොතට ආවේ...........*** පවුලෝ කොයිලෝ (Paulo Coelho) නම් බ්‍රසීල ලේඛකයාගේ "ගලන ගඟ වගේ" (Like the Flowing River) නම් ඉංග්‍රීසි පොතේ "පැන්සලේ කතන්දරය" (The Story Of The Pencil) නම් පරිච්ඡේදයෙනි.

ඒ.එන්.විතානගේ
සංවර්ධන නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
පිළිමතලාව

# හරිත විප්ලවය සහ පාරිසරික අර්බුද



"තිරසර ජෛව ලෝකයක් සදාහරිත ජීවිතයක්" යන තේමාව භාවිතා කරමින් මෙවර ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ එනම් "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" යන ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ සියලු ජීවීන්ගේ පැවැත්ම තහවුරු කෙරෙන තිරසර පරිසරයක දැක්ම පිළිබඳව සටහන් කර ඇත. ඒ යටතේ මේ වන විට ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන පාරිසරික අර්බුදය පිළිබඳවත් එම අර්බුදයෙන් ශ්‍රී ලාංකීය පරිසරය මුදවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් මනාව ඉදිරිපත් කර ඇත.

මෙවර ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ පාරිසරික තිරසාර සංවර්ධනය වර්ධනය කිරීම සඳහා භාවිතා කළ හැකි ප්‍රධාන මූලධර්ම දහයක් පිළිබඳව සටහන් කර ඇති අතරම, තිරසාර පාරසරික වටපිටාවක් නිර්මාණය කිරීම උදෙසා ගත යුතු ක්‍රියාමාර්ග ගණනාවක් විස්තර කර ඇත. ඒ යටතේ, නිවැරදි භූමි භාවිතය, සුරක්ෂිත ජල පරිභෝජනය, සාගර සහ වෙරළ කලාපයේ තිරසාර පැවැත්ම, පිරිසිදු වායුගෝලයක පැවැත්ම, පරිසර සුරක්ෂතාව සඳහා නීතිය හා සමාජ සම්මුතීන්, කඳුකර බිම්, පහත බිම්, තෙත් බිම් වැනි සෑම අංශයක් කෙරෙහිම විශේෂ අවධානයක් යොමු කර ඇති බව හඳුනා ගත හැකි විය.

ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර ඇති පාරිසරික අර්බුද නිර්මාණය වීමට හරිත විප්ලවය බලපා ඇති ද යන්න පිළිබඳව හඳුනා ගැනීම සඳහා හරිත විප්ලවය ආරම්භය සමඟ ලෝකයේ සිදුවූ වෙනස පිළිබඳවත්, ඒ හා

සමගාමීව ශ්‍රී ලාංකීය පරිසරය තුළ සිදු වූ පාරිසරික බලපෑම පිළිබඳවත් ද්විතීක දත්ත භාවිතා කරමින් සහ අන්තර්ජාලය භාවිතා කරමින් හඳුනා ගැනීමට ගත් උත්සාහයක් ලෙස මෙම වාර්තාව හඳුනා ගත හැකිය.

ආහාර හිඟය හා ප්‍රමාණවත් පරිදි ආහාර නොලැබීම ඈත අතීතයේ සිටම මුළු මහත් මානව සංහතියටම බලපාන ලද ප්‍රධාන සමාජ ගැටලුවකි. අතීතයේ භාවිතා කරනු ලැබූ කෘෂිතාක්ෂණයේ පැවති අඩු ලුහුඬකම් හේතුවෙන් වගා කරනු ලබන භූමි ප්‍රමාණයට සාපේක්ෂව සරිලන අස්වැන්නක් ලබා ගැනීමට එකල ගොවීන්ට හැකියාවක් නොතිබුණි. මේ නිසා වැඩි අස්වැන්නක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් වගා කරනු ලබන භූමි ප්‍රමාණය වැඩි කිරීමට ගොවීන් උත්සාහ ගන්නා ලදි. නමුත් ඒ හරහාද සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වූයේ වගා කිරීමට යෝග්‍ය පස සහිත භූමි ප්‍රමාණය සීමාකාරී වීමය. මේ සමඟ වැඩි අස්වැන්නක් ලබා ගැනීමට නව කෘෂිතාක්ෂණය පිළිබඳ දැනුම සොයා යෑමට ලොව පුරා විවිධ විද්වතුන් පර්යේෂණ කරනු ලැබිය. මේ හේතුව නිසා පවතින භූමි ප්‍රමාණයෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් ගැන අවධානය යොමු කරන්නට විය. මේ හරහා කෘෂිතාක්ෂණික ක්‍රම අධ්‍යයනය කිරීම පිළිබඳව මිනිසාගේ ප්‍රමුඛ අවධානය යොමු විය.

මෙක්සිකෝවේ එවකට සිටි ජනාධිපති “මැනුවෙල් ඇවිලා කැමචොර්” සහ “රොක්ෆෙලර් පදනම” අතර ඇති වූ සහයෝගතාවය මත “විශේෂ අධ්‍යයන සඳහා වූ ආයතනය” පිහිටුවීමත් සමඟ නව කෘෂිකාර්මික ප්‍රභේද පිළිබඳව අධ්‍යයනය කිරීමට පටන් ගන්නා ලදි. එහි දී ඇමෙරිකා එක්සත් ජනපදයේ හා මෙක්සිකෝවේ විද්‍යාඥයන්ගේ එකමුතුවෙන් වැඩි අස්වැන්නක් ලබා දෙන හා පසට අමතරව එකතු කරන ලබන රසායනික පොහොරවලට හොඳින් ප්‍රතිචාර දක්වන්නා වූ බෝග ප්‍රභේද වැඩි දියුණු කිරීමට කටයුතු ආරම්භ කරන්නට විය. මෙසේ ආරම්භ කරන ලද පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස “රොක්ෆෙලර් පදනමේ” ප්‍රධානියා වූ “ආචාර්ය නොර්මන් බොලෙර්ගා” ගේ මඟ පෙන්වීම යටතේ ඉහත කී අවශ්‍යතා සපුරාලනු ලබන නව තිරිඟු ප්‍රභේදයක් නිපදවීමට හැකියාව ලැබුණි. එය ලොව පුරා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් සිදු කිරීමට හැකි නව සොයා ගැනීමක් විය. මෙම බෝග ප්‍රභේදය හඳුන්වාදීම සමඟ පැමිණි දියුණු කෘෂිතාක්ෂණික ක්‍රමවේදය “**හරිත විප්ලවය**” යනුවෙන් හඳුන්වනු ලැබීය. ඒ අනුව 1943 වසරේ හරිත විප්ලවය ආරම්භ විය. හරිත විප්ලවය යන සංකල්පය තුළ මූලික පරමාර්ථය වූයේ ඒකක භූමි ප්‍රමාණයකින් ලැබෙන අස්වැන්න වැඩි කර ගැනීමයි. මේ යටතේ අධ්‍යයන හා පර්යේෂණ කිරීමෙන් පසුව විශ්මිත බීජ (miracle seeds) නමින් හඳුන්වනු ලබන නව අධි ඵල බීජ හඳුන්වා දෙනු ලැබීය. “ලොව පුරා සාගින්න තුරන්කිරීම” නමැති ප්‍රකාශිත අරමුණින් යුතුව ඇරඹුණු හරිත විප්ලවයේ අප්‍රකාශිත සැබෑ අරමුණු රැසක් තිබිණි.

මෙලෙස නව්‍ය වශයෙන් හඳුන්වා දෙනු ලැබූ අධි ඵල ප්‍රභේද අනෙකුත් ප්‍රභේද සමඟ සසඳන විට අධි ඵල ප්‍රභේදවලට නයිට්‍රජන් පොහොර අවශෝෂණය කර ගැනීමේ වැඩි විභවතාවක් පවතී. මෙලෙස අධිකව නයිට්‍රජන් අවශෝෂණය නිසා ඵලදාව නෙලීමට පෙර බෝග ඇද වැටීම සිදුවන නිසා පසුව එයට විසඳුම් ලෙස බෝගවල උස පාලනය කිරීමට ද පියවර ගත්හ. එහි ප්‍රතිඵලයක් ලෙස "ඔරිවිල් මෝගෙල්" විසින් ජපාන තිරිඟු ප්‍රභේදය උපයෝගී කරගනිමින් නිෂ්පාදනය කරනු ලබන "නොරින් 10" තිරිඟු ප්‍රභේදය උසින් අඩු ශාක කඳන් සහිත තිරිඟු ප්‍රභේදයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. එලෙසම අන්තර්ජාතික සහල් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබූ IR8 සහල් ප්‍රභේදය ද මෙවැනි බෝග වර්ගයකි (වේහැල්ල, 2021). නයිට්‍රජන් අවශෝෂණය වැඩි වීමත් සමඟ රසායනික පොහොර නිෂ්පාදනය ද ඉහළ දමන්නට විය. එමෙන්ම කෘමි සතුන්ගෙන් හා වෙනත් බාහිර හේතුන්ගෙන් වන හානිය අවම කරලීම සඳහා කෘතිම පළිබෝධනාශක වැඩි වශයෙන් නිෂ්පාදනයට හා ඒවා භාවිතයට ගොවින් හුරු විය. අවසානයේ ප්‍රමාණවත් තරමට ජලය, පොහොර හා කෘතිම පළිබෝධනාශක හේතුවෙන් අධි ඵල ප්‍රභේද වලින් ලැබෙන අස්වැන්න සාම්ප්‍රදායික බෝග ප්‍රභේදවලින් ලැබෙන අස්වැන්නට වඩා කැපී පෙනෙන වර්ධනයක් ඇති බව දක්නට ලැබුණි.

"ඇන්ඩෘ පියසර්" නම් විද්‍යාඥයා පෙන්වා දෙන ආකාරයට හරිත විප්ලවය මූලික අංග තුනකින් සමන්විත වන බවයි. එනම් තාක්ෂණික විප්ලවය, රසායනික විප්ලවය සහ ආයතනික හා සේවා විප්ලවය යනුවෙනි. මේ අනුව,

- තාක්ෂණික විප්ලවය - විද්‍යාත්මක පර්යේෂණ තුළින් ඉහළ අස්වැන්නක් සහිත බීජ වර්ග සොයා ගැනීම සහ ඒවායේ වර්ධනයන් සිදුවීම.
- රසායනික විප්ලවය - පොහොර, කෘමිනාශක, වල් නාශක නිපදවීම හා ඒවා භාවිතය ඉහළ යාම.
- ආයතයක සහ සේවා විප්ලවය - ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටවීම, ගොවි ණය පහසුකම් ලබාදීම, කෘෂි දැනුම ලබාදීම ආදී පහසුකම් ලබාදීමය.

ලෙස කෙටියෙන් හඳුනා ගත හැකිය. මේ අනුව පෙනී යන්නේ හරිත විප්ලවය යනු එක් අංශයක් පමණක් නොව, මෙම අංශ තුනේම එකතු වන බවයි. මෙම අංශ තුන නිවැරදිව සිදුවන විට විප්ලවයේ සාර්ථක ප්‍රතිඵල ඕනෑම රටකට ළඟා කරගත හැකි බව පැහැදිලිය.

හරිත විප්ලවය මෙලෙස මෙක්සිකෝව තුළ ජනප්‍රිය වීමත් සමඟ 1951 වන විට මෙක්සිකෝ රජය තිරිඟු නිෂ්පාදනය සම්බන්ධයෙන් ස්වයං පෝෂිත තත්ත්වයකට පත්විය. පසුව අතිරික්තය අපනයනය කිරීමක්

දක්වා වර්ධනය විය. 1961 වන විට ඉන්දියාව සාගත තත්ත්වයකට ඉතා ආසන්න මොහොතේ ඉන්දියාව තුළ ද හරිත විප්ලවය ක්‍රියාත්මක විය. පසුව පකිස්ථානය, තුර්කිය සහ ලෝකයේ අනෙක් ප්‍රදේශ රාශියක මෙම ක්‍රමවේදය ක්‍රියාවට නැංවීම තුළින් තිරිඟු ඇතුළු ධාන්‍ය අස්වැන්න ඉහළ නැංවීමට හැකියාව ලැබුණි.

ලෝකයේ අනෙකුත් රටවල් අතරින් ශ්‍රී ලංකාව ද ඉතා ඉක්මනින් හරිත විප්ලවය හා එක් වී ප්‍රතිඵල ලබා ගත් රටක් ලෙස හඳුනාගත හැකිය. 1975 පමණ වනවිට මුළු වී නිෂ්පාදනය කරන භූමි ප්‍රමාණයෙන් 60% ක් පමණ නව අධි ඵල බීජ ප්‍රභේද වගා කරන බිම් තිබූ බවත්, වර්තමානය වනවිට මුළු වී නිෂ්පාදනය කරන භූමි ප්‍රමාණයෙන් 95% ක් පමණ නව අධි ඵල බීජ ප්‍රභේද මඟින් වගා කරන බවද හඳුනා ගත හැකිය. 1965 - 1985 අතර කාලයේ ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය 3.5 ගුණයකින් ඉහළ ගිය අතර, වී අස්වැන්න දෙගුණයකින් පමණ ඉහළ ගොස් ඇත (වේහැල්ල, 2021).

අස්වැන්න වැඩි වීම හා ඒ සමඟම ගොවීන්ගේ සාමාජීය, ආර්ථික දියුණුව ඇති වීමටත්, ජනතාවගේ ආහාර අවශ්‍යතාවය සපුරාලීම තුළින් කුසගින්න නිවාලීමටත්, රටක් ස්වයංපෝෂිත වීමටත්, රටක ආර්ථිකය ශක්තිමත් වීමටත් හරිත විප්ලවය සෘජුවම මැදිහත් විය. හරිත විප්ලවයත් සමඟ ඇති වුණු කෘෂිකර්මාන්තයේ සිදු වූ විප්ලවීය දියුණුවට අමතරව ඒ හා සමගාමීව සිදු වුණු කෘෂිතාක්ෂණයේ ක්ෂණික විස්තාරණය හේතු කොටගෙන විවිධ ගැටලු රාශියක් මතු වී ඇත. **මේ ගැටලුවල විශේෂත්වය වන්නේ ඒවායේ ප්‍රතිවිපාකවලට මුහුණ පෑමට සිදුවී ඇත්තේ ඉදිරි පරම්පරාවට වීමයි.** මේ තත්ත්වය ලෝක ප්‍රජාවට තේරුම් ගැනීමට හැකි වූයේ හරිත විප්ලවයේ නවීන විද්‍යාත්මක සංකල්පය හා තාක්ෂණයන් භාවිතා කරමින් කෘෂි කර්මාන්තය සීඝ්‍ර වර්ධනයක් සිදු වූ ප්‍රදේශවලින් පසු කාලීනව වාර්තා වූ පාරිසරික, සෞඛ්‍යමය හා සාමාජීය ගැටලු ඇති වීමත් සමඟය. මෙම ගැටලුවල මූල බීජය සොයා ගැනීමේදී අනාවරණය වූයේ හරිත විප්ලවය මේ ගැටලු ආරම්භ වීමට සෘජුවම මැදිහත් වන බවයි.

**හරිත විප්ලවය සමඟ ඇති වූ පාරිසරික බලපෑම**

හරිත විප්ලවයත් සමඟ ජනප්‍රිය වූ කෘතීම රසායනික පොහොර හා කෘතිම පළිබෝධනාශක භාවිතය හේතුවෙන් ඇති වූ සමාජීය, සෞඛ්‍ය හා පාරිසරික ගැටලු රාශියක් විය. හරිත විප්ලවයෙන් පසු මතු වූ ප්‍රධාන පාරිසරික ගැටලු කිහිපයක් මෙලෙස හඳුනා ගත හැකිය.

i. වනාන්තර හෙළි පෙහෙළි කිරීම.
ii. පසෙහි ගුණාත්මක භාවයට හානි වීම.
iii. පළිබෝධනාශක විෂ වීම.

iv. ජලය අධි භාවිතය නිසා ඇතිවන ගැටලු හා ජල මාර්ග දූෂණය වීම.

v. පරිසරයට ඔරොත්තු නොදෙන කෘමි නාශක හා වල් නාශක භාවිතය නිසා ජෛව විවිධත්වය විනාශයට පත්වීම.

vi. පස ලවනීකරණය වීම.

vii. භූගත ජල මට්ටම පහල බැසීම.

වැනි පාරිසරික වශයෙන් සිදුවන ගැටලු රාශියක් හඳුනා ගත හැකිය. මේ අනුව හරිත විප්ලවයේ සාර්ථක අංශය පිළිබඳව මෙන්ම හරිත විප්ලවයේ දුර්වල අංශයේ පිළිබඳවද හඳුනා ගැනීම වැදගත්ය. ඒ අනුව,

**වනාන්තර හෙළි පෙහෙළි කිරීම**

ශ්‍රී ලංකාවේ මුළු වගා බිම් ප්‍රමාණයෙන් 95% ක් පමණ ප්‍රමාණයක් නව අධි ඵල ප්‍රභේදයන් හා නව තාක්ෂණික ක්‍රමයන් මඟින් වගා කෙරුණත් තවමත් සහලින් ස්වයංපෝෂිත වීමට නොහැකි වී ඇත. හරිත විප්ලවය හඳුන්වා දුන් පසුත් කොතරම් නව වගා බිම් ප්‍රමාණයක් වනාන්තර බිම් හෙළි පෙහෙළි කරමින් නිර්මාණය වනවාද යන්න තුළින් හඳුනාගත හැකි වූයේ හරිත විප්ලවය සිදු වුවත් වනාන්තර හෙළි පෙහෙළි කිරීම නොනැවතී ඇති බවයි. හරිත විප්ලවයේ ප්‍රධාන අරමුණ වන්නේ පවතින භූමි ප්‍රමාණයෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් නිර්මාණය කිරීම උවත් අද වන විටත් වනාන්තර හෙළි පෙහෙළි කිරීම සිදු වන බවයි. මේ නිසා නූතනය වන විට ගැටලු රාශියක් වර්ධනය වී ඇත. උදාහරණ වශයෙන් වනාන්තර හෙළි පෙහෙළි කිරීමත් සමඟ ජෛව විවිධත්වය විනාශයට පත්වීම, පාංශු ඛාදනය, වන අලි තර්ජනය, උෂ්ණත්වය ඉහල යාම වැනි ගැටලුකාරී තත්ත්වයන් හඳුනා ගත හැකිය.

**හරිත විප්ලවය සමඟ පසට සිදුවී ඇති හානි**

ප්‍රධාන වශයෙන් පසට මේ හරහා සිදුවන බලපෑම් සලකා බලන විට වාණිජමය කෘෂිකාර්මික ක්‍රමවේදයන් භාවිතය හේතුවෙන් පසේ සාරවත්භාවය අඩුවීම හා වගා කිරීමට යෝග්‍ය ඉඩම් ප්‍රමාණය හිඟවී යාම දැක්විය හැකිය. අධි අස්වනු ප්‍රභේදවල අධික වර්ධන වේගයත්, ඉක්මන් පරිණත වීමත් නිසා පසේ ස්වාභාවිකව පවතින පෝෂක පසෙන් ඉක්මනින් ඉවත්වයාම සිදුවේ. මේ නිසා පසේ සාරවත්භාවය අඩුවේ. එසේම අධික ලෙස සිදුවන ජල භාවිතය නිසා එම ජලය වාෂ්පීභවනයට ලක්වීමෙන් පසේ ලවණ සාන්ද්‍රණය වීම ජල සංතෘප්ත තත්ත්වය ඇති වීම සිදුවේ. මෙසේ පස ජලයෙන් සංතෘප්ත වීමත් සමඟ පසේ පාංශු ජල මට්ටම වැඩි වීම හේතුවෙන් ශාක මුල් මැරී යාම හා මූල පද්ධතිය ආශ්‍රිත විවිධ රෝගවලට ශාක ලක්වීම හා මුල්වලට

අවශ්‍ය ඔක්සිජන් නොලැබී යාම නිසා මුල් මැරීයාම සිදුවේ. එලෙසම අධික ලෙස සිදුවන පළිබෝධනාශක හා කෘෂි රසායන භාවිත කිරීම් හේතුවෙන් පසේ රෝග ප්‍රතිරෝධී තත්ත්වය අඩු වී යාම සිදුවේ. උදාහරණයක් ලෙස බහු වාර්ෂික ශාකවල පොස්පේට් අවශ්‍යතාවයන් සඳහා භාවිතා කරන ඛණිජ පොස්පේට්වල විවිධ බැරලෝහ අඩංගුවේ. මෙලෙස අධික ලෙස පොහොර භාවිතය නිසා පසට එකතුවන බැරලෝහ වැඩි වී ඒවා ශාකවල සාන්ද්‍රණය වීම හේතුවෙන් ඒවා පරිභෝජනයට ගන්නා ජීවීන් තුළ විවිධ සංකූලතා ඇති වීම සිදුවේ. එවැනි සංකූලතා සහිත සත්ව නිෂ්පාදන පරිභෝජනයට ගන්නා මිනිස් ප්‍රජාවන් තුළද විවිධ සංකූලතා ඇති විය හැකිය. පසේ සාරවත්භාවය නැතිවී යාමට කදිම උදාහරණයක් ලෙස 1980 දී ඉන්දියාවේ මුඩබිම් සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන සංගමය හෙවත් SPWD (Society for Promotion of Wastelands Development) විසින් සිදුකරනු ලැබූ සමීක්ෂණයට අනුව ඉන්දියාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 39% හෙවත් හෙක්ටයාර් මිලියන 329 කම සාරවත්භාවය නැතිවී ඇති බව සොයාගෙන ඇත. මෙම තත්ත්වය හරිත විප්ලවය ආරම්භවීමට පෙර තත්ත්ව අනුව සසඳන කල හාත්පසින්ම වෙනස් බව පෙනී යයි (වේහැල්ල, 2021).

**ජලය අධි භාවිතය නිසා සිදුවන හානි**

හරිත විප්ලවයේ සංකල්පයන්ගේ තවත් එක් න්‍යායක් නම් ජලය අධි භාවිතය තුළින් සාර්ථක අස්වැන්නක් ලබාගැනීමයි. මෙලෙස ජලය අධිභාවිතය හේතුවෙන් ජලය හිඟවීම හා ජල මාර්ග දූෂණය වීම සිදුවේ. අධි අස්වනු ප්‍රභේදවල අධික වර්ධන වේගය හේතුවෙන් එම ශාක අධික ජල අවශ්‍යතාවයකින් යුක්තවී ඇත. මෙලෙස ජලය අධික ලෙස භාවිතා කිරීම නිසා ජලය හිඟ වී යාම භූගත ජලය අඩුවී යාම හා නළ ළිං සිඳී යාම වැනි තත්ත්ව ඇතිවන අතර මෙය අඳුරු කලාප (Dark Zone) ඇති වීම ලෙස හැඳින්වේ. මෙම තත්ත්වය බහුල ලෙස ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ හා පන්ජාබ් ප්‍රාන්තයේ විශාල ලෙස ඇති වී ඇත. ජල අවශ්‍යතාවයන් වැඩිවීමත් සමග ඊට අවශ්‍ය ජලය සැපයීම සඳහා ජලාශ ඉදිකිරීමට සිදුවීම නිසා විවිධ සමාජ ආර්ථික ප්‍රශ්නද හටගෙන ඇත.

**පළිබෝධනාශක භාවිතය නිසා ඇතිවන හානි**

විශාල වශයෙන් පාරිසරික හා සෞඛ්‍ය අර්බුද ඇති වීමට හේතුවී ඇති තවත් කෘෂිකාර්මික ක්‍රමයක් වන්නේ අධික ලෙස පලිබෝධනාශක භාවිතා කිරීමයි. අධික ලෙස පළිබෝධනාශක භාවිතා කිරීම මගින් වගාවන්ට පළිබෝධකයින්ගෙන් අධික ලෙස සිදුවන හානි අවම කරගැනීම පරමාර්ථය වී ඇත. නමුත් මෙලෙස අධික

ලෙස පළිබෝධනාශක භාවිතා කිරීම නිසා විවිධ ගැටලු ඇතිවී ඇති බව ඒගැන විමසීමේදී පෙනී යයි. විශේෂයෙන්ම තුන්වන ලොකයේ රටවල්වලට සංවර්ධිත රටවල් වලින් ගෙන්වනු ලබන බොහොමයක් පළිබෝධනාශකවල එම රටවල් විසින් තහනම් කර ඇති විවිධ රසායනික ද්‍රව්‍ය බහුල ලෙස ඇති බව බොහොමයක් පර්යේෂණ වලින් පෙනී යයි. එම සංයෝග බොහොමයක් අධික විෂ සහිත සංයෝග වන අතර උදාහරණයක් ලෙස DDT බෙන්සීන් හෙක්සා ක්ලෝරයිඩ් (BHC) වැනි අධික විෂ සහිත සංයෝග ඇති බව සමීක්ෂණ වාර්තා පෙන්නුම් කරයි.



හරිත විප්ලවය සමඟ ඇති වූ පාරිසරික බලපෑම නිසා අවසානයේ සිදු වන්නේ සෞඛ්‍යමය බලපෑම වර්ධනය වීමයි. ඒ පිළිබඳව කෙටියෙන් හඳුනා ගැනීමේදී, මෙම හරිත විප්ලවය නම් සංකල්පය හේතුවෙන් සිදුවන සෞඛ්‍යමය බලපෑම බොහෙමයක් දුරට පළිබෝධනාශක සමඟ බැඳී පවතී. අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය (IRRI) විසින් සර්ම කලාපීය රටවල පළිබෝධනාශක භාවිතා කරමින් ගොවිතැන් සිදුකරන ගොවීන් අතර සිදුකරනු සමීක්ෂණයකට අනුව එම ගොවීන්ගෙන් 55% ක් අක්ෂි ආබාධ වලින් පෙලෙන බවත්, 54%ක් රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝගවලින් පෙලෙන බවත් හා 41%ක් පෙනහළු ආබාධ වලින් පෙලන බවටත් හෙළිවී ඇත. එමෙන්ම ඉන්දියාවේ අධ්‍යාපනය හා පර්යේෂණ සඳහා වන පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය කරනු ලැබූ සමීක්ෂණයකට අනුව පන්ජාබ් ප්‍රාන්තයේ ඇතිවී ඇති පිළිකා අර්බුදය හා කෘමිනාශක භාවිතය අතර සෘජු සම්බන්ධතාවයක් ඇති බව පෙනී යයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ වකුගඩු ආශ්‍රිත රෝග වර්ධනය වීම සඳහාද පළිබෝධනාශක භාවිතය හා සෘජු සම්බන්ධතාවයක් පවතින බව පර්යේෂණ වලින් අනාවරණය වී ඇත.

පළිබෝධනාශක මිනිස් සිරුර තුළට විවිධ ක්‍රම හරහා ඇතුල්වේ. මෙලෙස ශරීරය තුළ එකතුවන විෂ රසායනික හේතුවෙන් මිනිසුන්ට විවිධ සංකූලතා ඇතිවේ. කාර්බමයිල් හා ෆීනොක්සි අම්ල අඩංගු වල්නාශක නිසා නොමේරූ ළදරු උපත් ඇති වීම සිදුවිය හැකි අතර 24DPA වලට මිනිස් ශුක්‍රාණුවල සාන්ද්‍රවීමේ හැකියාවක් ඇති අතර, ඒ නිසා උපදින දරුවන් තුළ විවිධ සංකූලතා ඇති විය හැකිය. තත්ත්වය වඩාත් දරුණු වන්නේ මෙලෙස භාවිතා කරනු ලබන රසායනික ද්‍රව්‍ය හේතුවෙන් භූගත ජලය දූෂණය වීමයි. පස මතුපිට ඇති කෘමිනාශක භූගත ජලයට එකතු වීම නිසා භූගත ජලය විවිධ බැරලෝහ අයන වලින් දූෂණය

වීම සිදුවේ. දැනට උතුරුමැද පළාත කේන්ද්‍රකරගෙන ඇති වී ඇති වකුගඩු රෝගයට එක් හේතුවක් ලෙස දැක්වෙන්නේ බැරලෝහ වලින් භූගත ජලය දූෂණය වීමයි. මේ අනුව පෙනී යන්නේ හරිත විප්ලවය මඟින් ප්‍රධාන මිනිස් අවශ්‍යතාවන සාගින්න තුරන්කිරීමට හැකි වුවත් ඒ හා සමගාමීව සමාජීය, පාරිසරික, සෞඛ්‍යමය වශයෙන් බලපෑම මිනිසගේ පැවැත්මට ඇති කරන බවයි.



මේ අනුව පැහැදිලි වූයේ හරිත විප්ලවය පාරිසරික සමතුලිතතාවය අහෝසි කිරීමට මැදිහත් වී ඇති බවයි. “තිරසර ජෛව ලෝකයක් සදාහරිත ජීවිතයක්" ලගා කර ගැනීමට නම් ඉහත කි කරුණු පිළිබඳව පැහැදිලිවම අවධානය යොමු කළ යුතු වේ. නිවැරදි අවධානය සහ නිවැරදිව කටයුතු කිරීම තුළින් "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කරා ලගා විය හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. උදයංග, සම්පත්.(2021).ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකාර්මික පුනර්ජීවන ව්‍යාපාරයක නැගීම සහ තරුණ ගොවීන්ගේ මැදිහත් වීම.සමාජ විද්‍යා අධ්‍යනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය.
2. ප්‍රජශක්ති සඟරාව.(2020) ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
3. https://divaina.lk
4. https://www.facebook.com
5. https://www.linkedin.com/pulse
6. https://news.ejustice.lk
7. https://si.warbletoncouncil.org/revolucion-verde-15895
8. https://si.wikipedia.org/wiki
9. https://wwwsilumina.lk



එස්.බී.එන්.මල්ෂානි ආනන්ද

සංවර්ධන නිලධාරී

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, පිළිමතලාව

# "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ඇතිකිරීම සඳහා ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයින් බලගැන්වීමේ වැදගත්කම

හැඳින්වීම

පරිසර අවස්ථා නිර්මාණශීලීව උකහා ගනිමින් හා අවදානමක් දරමින් නව නිෂ්පාදනයක් ලෙස වෙළඳපලට ඉදිරිපත් කර ධනය උත්පාදනය කිරීම දක්වා වූ ක්‍රියාවලිය ව්‍යවසායකත්වය ලෙසද එම කාර්යයේ නිරත වන්නා ව්‍යවසායකයා ලෙසද හඳුන්වනු ලබයි. ඔහු මිනිසාගේ මූලික අවශ්‍යතාවයන් වුවමනාවන් තෘප්තිමත් කිරීමට කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ආර්ථික කටයුත්තක නිරත වේ.

ඕනෑම රටක සමාජ, ආර්ථික සංවර්ධනය උදෙසා එහි ව්‍යවසායකයින් අති මහත් දායකත්වයක් සපයනු ලබයි. සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ බහුතරය ග්‍රාමීය ජනතාව වන අතර, ශ්‍රී ලංකාවේ බොහෝමයක් ව්‍යවසායන්, ග්‍රාමීය ප්‍රෙද්ශ ආශ්‍රිතව ග්‍රාමීය ව්‍යවසායන් වශයෙන් ග්‍රාමීය ජනතාව විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

ග්‍රාමීය ව්‍යවසායකත්වය යනු ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ආදායම් උපයා ගැනීමේ නිෂ්පාදන සහ සේවා සපයන කාර්යයන්ට අයත් ව්‍යාපාරික ක්‍රියාකාරකම් වේ. මෙම ක්‍රියාකාරකම් වල නිරත පුද්ගලයින් ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයින් වන අතර ඔවුන් තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කරමින් ජීවිතය ගොඩනගා ගැනීමට උත්සාහ දරණ පුද්ගලයන්ය. මෙය පවුලේ ආර්ථිකයට, ප්‍රෙද්ශයට මෙන්ම ජාතික ආර්ථිකය සඳහා ද වැදගත් වන අතර, දේශීය නිෂ්පාදනය, රැකියා අවස්ථා, සහ ප්‍රජා සවිබල ගැන්වීම වර්ධනයටත් හේතු වේ.

මෙලෙස ව්‍යවසායකත්ව කාර්යයයෙහි නිරත පුද්ගලයින් සඳහා අවශ්‍ය දැනුම, ආධාර, සම්පත් සහ විශේෂයෙන්ම ව්‍යාපාරික අවස්ථා ලබාදීම මගින් ඔවුන් ව්‍යවසායකත්වයේ සාර්ථකයන් බවට පත් කිරීම සඳහා කරනු ලබන සියළුම උත්සාහයන් බලගැන්වීම ලෙස හඳුන්වනු ලබයි.ග්‍රාමීය සුළුපරිමාණ ව්‍යවසායකයන් විසින් දේශීය ආර්ථිකයට, ව්‍යවසායකයාට හා පාරිභෝගිකයාට විවිධාකාර ප්‍රතිලාභ අත්කර දෙනු ලබයි.

## දේශීය ආර්ථිකයට...........

- රටේ ජාතික නිෂ්පාදනය ඉහළ යාම
- ආර්ථික සංවර්ධනයට දායක වීම
- ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුවීම
- දේශිය සම්පත් උපයෝජනය හා ග්‍රාමීය ව්‍යාපාරයන්ගෙන් ආදායම ජනනය වෙමින් ප්‍රාදේශීය ආර්ථිකය සවිමත් වේ.
- නව භාණ්ඩ හා සේවා වෙළඳපොළට ඉදිරිපත් කිරීම
- දරුවන්, තරුණයන්, සහ ගෘහණියන්ට ආදායම් ලබාගැනීමේ නව අවස්ථා උදා වේ
- නව රැකියා අවස්ථා ජනනය කිරීම හා ඒ තුළින් සේවා නියුක්තිය ඉහළ යාම
- ආදායම් මට්ටම ඉහළ යාම හා ඒ අනුව ක්‍රය ශක්තිය ඉහළ යාම
- නිමැවුම් අපනයනය කිරීම මගින් විදේශ විනිමය ඉපයීමේ හැකියාව
- ප්‍රජා මූලික ව්‍යාපාරික අරමුණු සහ ජීවන මාර්ගය තීරණය කරගැනීමේ හැකියාව වැඩිවේ
- දේශීයව නිපදවනු ලබන භාණ්ඩ හා සේවා හරහා තිරසාර සංවර්ධනය

## ව්‍යවසායකයාට.............

- පුද්ගල හැකියා වලින් ප්‍රෙයා්ජන ලබාගත හැකිවීම
- ආදායම් උත්පාදනය හා ලාභ ඉපයීමට හැකිවීම
- කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකිවීම
- ස්වයංපෝෂිත බව
- ප්‍රයෝජනයට නොගත් සම්පත් හා හැකියාවන් යොදාගත හැකි වීම
- සමාජයීය සුභ සාධනය සඳහා දායක වියහැකි වීම
- ව්‍යාපාරයේ ප්‍රධානියා වීමේ අවස්ථාව
- සමාජ තත්ත්වය හා පිළිගැනීම ඇතිවෙයි.

## පාරිභෝගිකයාට.........

- නව භාණ්ඩ හා සේවා ලබාගැනීමට හැකිවීම
- ඉහළ ගුණත්වයෙන් යුත් භාණ්ඩ හා සේවා ලබාගැනීමට හැකිවීම
- තම අවශ්‍යතා හා වුවමනා අනුව භාණ්ඩ හා සේවා ලබාගැනීමට හැකිවීම
- වියදම් අඩු කර ගැනීමට හැකිවීම
- පහසුවෙන් ළඟාකර ගතහැකි වීම
- ප්‍රදේශයට ගැලපෙන භාණ්ඩ හා සේවා ලබාගැනීමට හැකිවීම

## අභියෝග..........

- මූල්‍ය පහසුකම් හිඟය
- වෙළඳපොළ පිවිසුම සීමාවීම
- තාක්ෂණික දැනුමෙහි හිඟය
- රජයේ සහන සැලසුම් වල ප්‍රමාද
- නීතිමය බාධාවන්

## බලගැන්වීමේ ක්‍රියාමාර්ග........

1. මුල්‍යමය සහාය ලබාදීම

ණය, අරමුදල් සහ මූලික ආයෝජන ලබා දීම ඔවුන්ට ව්‍යාපාර ආරම්භ කිරීමේ පහසුවක් සලසා දීම හා දිරිගැන්වීම් සිදුකිරීම.

ග්‍රාමීය ව්‍යාපාර සඳහා මෘදු ණය පහසුකම් ලබාදීමට සැලැස්වීම.

2. පුහුණු වැඩසටහන් සහ උපදේශන සේවා

ව්‍යාපාර කළමනාකරණය, අලෙවි කළමනාකරණය, ගිණුම්කරණය, පිරිවැයකරණය, නවීන සන්නිවේදන හා තාක්ෂණික පුහුණු, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ආදිය පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් දැනුම,කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම.

3. නීතිය සහ ආරක්ෂාව

නීතිමය ආරක්ෂාව, බදු ප්‍රතිපත්ති සහ විශාල වෙළඳපොළකට පිවිසෙන්නට අවස්ථා ලබාදීම.

4. සන්නිවේදන සහ ජාලගත කිරීම

වෙනත් ව්‍යවසායකයින් සමඟ සම්බන්ධ වීමෙන් තම ව්‍යවසාය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබෙන අතර නව වෙළඳපොළ අවස්ථා ඇතිකර ගැනීමට හැකියාව ලැබේ.

5. පළාත් හා ජාතික වෙළඳපොළ සමඟ සම්බන්ධකරණය.

නිගමනය

ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයින් බලගැන්වීම යනු රටක් පොහොසත් කිරීමේ මූලික මඟකි. ඔවුන්ට අවශ්‍ය සහයෝගය, අධ්‍යාපනය, මූල්‍ය සහ වෙළඳපොළ සම්බන්ධතා ලබාදීමෙන් ඔවුන් සමාජ සහ ආර්ථික වශයෙන් බලගැන්වීම තුළින් යහපත් ජීවිතයක් උදාකරගත හැකිය. එසේම, ලස්සන ජීවිතයක් සඳහා ස්වයංපෝෂිතත්වය, ආරක්ෂාව සහ ගෞරවය යන කරුණු ඉතාම වැදගත්ය.සම්පූර්ණයෙන්ම, පොහොසත් රටක් වීමටත්, ජනතාවට ලස්සන ජීවිතයක් උදාකරදීමටත්, ග්‍රාමීය ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම අනිවාර්ය මාර්ගයකි.

සුභානි පියසිංහ
සංවර්ධන නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, පිළිමතලාව

# පවුර සිතුවිලි අරණ

පිටිසර සුන්දර ගම
නමින් කිරිමැටිය විය
වැවු බැම්මක් කඩාවැටී
අත්විය ඔවුනට දුක

වැස්ස නැති වුණා ගමේ
කුඹුරු පාළු වී ගියේ
ගම් බිම් හැර හය හත් දෙන
නගරෙ බලා දුර ගියේ

ජීවත් වන්නට රිසි
රැකියාවක් සොයමිනි
කුලී වැඩට ගියා ගමේ
කීප දෙනා කැඩී කැඩී

තිලකරත්න මූලික
කිරිබංඩා සමඟින
හරියන්නෑ මේ වැඩේ
කතිකා විය හිමිහිට

බලා ඉඳල ඵල නැති
අපිම යමක් කළ යුතු
වලෙන් ගොඩට එන්නට නම්
වලටම බැස යුතු වෙති

එකතු වුණා සතුටින
කථා කළා සැම දෙන
බැම්ම ඉදි කෙරුම තමයි
අප සැම ගොඩයන මඟ

සතෙන් සතේ රුපියල
වැඩි වුණා අක්කරේකට
නැවත නැවත රැස් වී හැම
කථා කළා අරමුණ

ගල් වැලි හා සිමෙන්ති
සොයා ගත්තේ වෙහෙස වී
අපේම දේ යන හැඟීම
තිබුණා හැම දිනේ දී

කිරිමැටියේ විස්කම
හඳුනා නිලදර සැම
එකතු වෙලා සැමටම
උදව් කළා යහමින

අපි දිනූ මේ සමිතිය
අප සැමගේ වත්කම
රැගෙන යමින් පෙරටම
සැම ජය ගමු එකතුව

පුහුණු වැඩසටහනකදී කණ්ඩායම් අභ්‍යාසයක් සඳහා ලබා දුන් සිද්ධි අධ්‍යයනයක් ඇසුරින් නිර්මාණය කරන ලද විරිඳු පංතියකි.
(සහභාගීත්ව නායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව)

ඩී.එච්.එම්.නයෝමි
ග්‍රාම නිලධාරි
පාතදුම්බර

## සංවර්ධනය හා සංස්කෘතික ආගම.......

*ව්‍යවසායකයා*
*අතරමංව*
*හතරවටේ ණය වෙලා*
*කුවේණිය ළඟ ඉදං*
*කඳුළු සළයි - මහ බලා*

*මහපාරේ ඉරිතලා*
*බොරළු ගොඩත්*
*විසිරිලා........*
*ඇළ දොළ ද පුපුරලා*
*මහ යායම ඉරිතලා*
*බඩ කටටම බොල් වෙලා*
*මසමානවක තනිවෙලා*
*හිතේ දුකින් මිරිකිලා*

*වහරකලා රහත් වී*
*මීමනලා බුදු වීලා*
*යශෝදරා කඳුළු බිබී*
*බුදුන් සොයයි හඬ හඬා*
*විශාකාව මහළුව දැන්*
*මුසපත් වී දුක කියයි*

*තවදුරටත් නොනැවතිලා*
*අනේ පිඩුට නිවනක් නැත*
*දේවදත්ත ලුහු බැදලා*
*අහස් කුසට දැත් යොමා*
*සුජාතාව නිවන සොයයි.*

*ප්‍රියශාන්ත කාරියවසම්*
*පුහුණු හා පර්යේෂණ නිලධාරි*
*ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා*
*පර්යේෂණ ආයතනය*

## මට ආසයි වෙනද වගේ ආයෙත් බැංකුවට යන්න..........

දුප්පතුන්ගෙ දුක නැතිකර සමෘද්ධියෙන් පිහිට වෙන්න
කිරට හඬනකිරි දරුවගෙ බඩේ ගින්න නිවාලන්න
පාසල්යන පොඩි දරුවගෙ අනාගතේ සරු කරන්න
මට ආසයි වෙනද වගේ ආයෙත් බැංකුවට යන්න

මගෙ වසමේ දුප්පතුන්ව දරිද්‍රතාවෙන් මුදන්න
සතේ සතේ එකතු කරල අනාගතේ ගොඩනගන්න
පියා නැතත් පොඩි එවුන්ගෙ සිහින ගෙපැල ඉදිකරන්න
මට ආසයි වෙනද වගේ ආයෙත් බැංකුවට යන්න

පාසල් පොත් නොමැති නිසා බැරිවී පාසලට යන්න
මවක් නොමැති පවුල් වලට මවක් වගේ උදව් වෙන්න
සිප් දොර ශිෂ්‍යත්වෙ ගෙනත් එළිපත්තෙන් තියල යන්න
මට ආසයි වෙනද වගේ ආයෙත් බැංකුවට යන්න

ඇඳේ ඉන්න මව් වරුන්ට වැඩිහිටි දීමනා දෙන්න
කොවිඩ් ආවා අපි හැමටම ගෙට කොටු වී සුසුම් ලන්න
හෙට මැරුණත් කම් නැමට යනවා මගෙ වුන් බලන්න
මට ආසයි වෙනද වගේ ආයෙත් බැංකුවට යන්න

ගන්න වැටුපට වැඩියෙන් අපිට වුණා වැඩ කරන්න
කිසිම දුකක් නෑ ඒකට අපිත් ආවේ වැඩ කරන්න
දැන්නම් කය දුබල වෙලා ටිකකි හෙමින් වැඩ කරන්න
මට ආසයි වෙනද වගේ ආයෙත් බැංකුවට යන්න

පාසල් දිවි අවසන් වී ආවේ ජොබ් එක කරන්න
යෞවනයත් ගෙවිල ගිහින් ජීවිතයේ හැටි කියන්න
කාලය මැව් වෙනසක අරුමය අපට හොඳින් බලා ගන්න
කාලය ඇවිදින් මට දැන් විශ්‍රාමෙන් කල් ගෙවන්න

*අජිත් කීංස්ලි*
*සමෘද්ධි සංවර්ධන නිලධාරි*
*හබරවැව*
*උඩුබද්දාව*

# ලියන්න අපට......

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන *ප්‍රජාශක්ති* විද්‍යුත් මාධ්‍ය සඟරාව ඔස්සේ විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් වල නිරතව ඔබ ලද අත්දැකීම් බෙදාහදා ගන්නට අප සූදානම්.

- ඔබේ අත්දැකීම් ලියන්න අපට..................

- ✓ ***ලිපියක් නම්.........*** A4 පිටු 3-6 අතර
- ✓ ***නිර්මාණයක් නම්.........*** සඳැස් හෝ නිසැඳැස් A4 පිටු 1
- ✓ Font - Skoola potha
- ✓ Font Size – 12

dodd.dtri@gmail.com

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය,
ග්‍රාම සංවර්ධන මාවත,
පිළිමතලාව.

☞ ඔබේ අදහස් හා යෝජනා අප වෙත යොමු කරන්න.

☞ දෙවන කලාපය සඳහා 2025.10.30 ට පෙර ලිපි හා නිර්මාණයන් යොමු කරන්න.